WWW.ALEVELAPI.COM 1899



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

2018.08.11 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) සතරමහමුහුද පැන් විතරටත් බොහෝව' යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සේ ශෝකදුඃඛය තුනී විය. ශෝකදුඃඛය තුනී තියාව දැනලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුඹූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු ය'යි වදාරා විසිවන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළසේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාර දෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොවිසැපතට ලොවුතුරාසැපතුත් යම්තම් විතරක් ලත්හ.

   (i) පටාචාරාවන්ගේ ශෝකදුඃඛය තුනී වූයේ කෙබඳු ආකාරයෙන් ද?

   (ii) ශෝකදුඃඛය තුනී වූ පසු බුදුන් වහන්සේ පටාචාරාවට කුමක් වදාළ සේක් ද?

   (iii) පටාචාරා තම ජාතිය ශුද්ධ කර ගත්තේ කෙසේ ද?

   (iv) **නටුවා වූ** හා **ලොවිසැපත** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

   (ආ) එකල්හි රජ කරන සොත්ථිසේන රජ්ජුරුවෝ තමන් හා එක් ව දුක් ගෙන ඇවිදි සම්බුලාවන්ට අග මෙහෙසුන් තනතුරු පමණක් දී සෙසු තිසි වෘත්තියක් නුදුන්නාහ. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ඇති බවත් නො දැන සෙසු ස්ත්‍රීන් හා සමග සිත් අලවා කෙළිමින් සෙමින් අභිරමණය කොට ඇවිදිනාහ. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් දුර්වල ව පඬුවත් සිරුරු ඇති ව ඉපිල හුණු නහර බහනින් වෙළඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ. ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති ඒ බිසව් එක් දවසෙක්හි රජ ගෙන් දන් අනුභව කරන්ට ආ මයිල් රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්නීය. එකල්හි තාපසයෝ ඉතා ම දුර්වල ව ශරීරයක් ඇති මිරිකුණා වූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දැක, දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියත්.

   (i) සොත්ථිසේන රජ තමන් හා එක්ව දුක්ගෙන ඇවිදි සම්බුලාවන්ට කෘතගුණ දැක්වූයේ කෙසේ ද?

   (ii) බිසව ශෝකයෙන් දුර්වල වූයේ ඇයි?

   (iii) රජතුමා සෙසු ස්ත්‍රීන් සමග සිත් අලවා විසීම කතුවරයා ඉදිරිපත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද?

   (iv) **මයිල්** හා **ඉඳුරන්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

(ඉ) මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නො ලැබ තෙරුන්වහන්සේගේ සමීපයට ම යෙමි යි සිතා විහාරයට ගොස් "ස්වාමීනි, ගැත්තවුට පිටිවහල් වුව මැනව, මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඔහු දැක කම්පා ව ළය පිරුණු ශෝක ඇති ව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු උණු පැනින් නහවා කුලාවෙන් තෙල් ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් තවමින් උන් කල්හි ඕහට බැටදුන් උපාසකයා උදෑසන්හි ම සොරා කොයි ගියේ දෝ හොයි විචාර විචාරා සොයා ඇවිදුනේ විහාරයට ගොස් සොරා පිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දැක ඔබ හා සමග කථා කරන්නා වූ උපාසක තෙම,

(i) සොරා විහාරයට ම ගියේ ඇයි?

(ii) විහාරයට පැමිණි සොරා තෙරුන්වහන්සේට කුමක් පැවසුවේ ද?

(iii) විහාරයට ගිය උපාසකයාට දක්නට ලැබුණේ කුමක් ද?

(iv) **පිටිවහලක්** හා **උනා ගෙන** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

(ඊ) නොසී කරන මිසදිටුවන් බස් අබඳ
නි සී නැණැති සිරි පැරකුම් රජුට නඳ
ර සී ගැඹුරු තෙපලෙන් සැක සිත පසිඳ
දෙ සී සුවාසූ දහසක් දහම් කඳ

ඒ හිමි කෙලෙස් ගිරි මුදුනින් වැහෙන සොඳ
දහම් අහස් ගඟ දූල දිය දහර වැද
නොමඳ සතොස් අම ඔදසින් පිරි නිබඳ
බැබැළි වෙසෙස් නරනිඳු සඳ කිරි මුහුද

(i) පැරකුම් රජතුමාට නිසී නැණ ඇතැයි කවියා පවසන්නේ කුමක් නිසා ද?

(ii) නරනිඳු සඳ කිරි මුහුද වෙසෙසින් බැබළුණේ ඇයි?

(iii) 'දහම් අහස් ගඟ' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.

(iv) **සුවාසූ දහසක් දහම් කඳ** යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "සෙසු වුවමනා දවස් නැති හෙයින් අදම වුවමනා ද?"

(ii) "ස්වප්නයෙන් දැකීම් වශයෙන් මහත් දොළක් උපන්නේ ය."

(iii) "ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනකැයි සිතමි."

(iv) "අපේ ගෙවල් ඔක්කොම පිළිස්සුණා යුද්දෙදි"

(v) "රජතුමනි කලබල වෙන්ඩ එපා"

(vi) "ගුණවතී .... ලොකු පුතා ද කෙඳිරි ගෑවේ?" (ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පරපුරක කළු දුඹුල් කඩා පිරිසුදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝදා සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිහින
මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින

ඇඳුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
පුව සිහිල නිදහසේ උරා බී සැප විඳින
ලෝකයේ පුස්ඹ පිරි තිරෙන ලෙස විවර වුණ
වලවුවට සිවු දිගින් සුළං රැලි විත් නටන

අලුත් වැස්සෙන් පෙඟුණු පින්තූරයෙන් එබෙන
රන් යවට සේ දැවෙන තාත්තාගෙ නෙත් වලින
දීප්තිය නිවී සේදී දුකට කඳුළු එන
රාමුවෙන් බිඳෙන් බිඳ පතිත වී ලිහී යන

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

ඇතුළු ගැබ නොදුටු අහුමුලු සොයා හඹායන
අලුත් වැහි හැළි වළං උතුරුවා ඇද වැටෙන
මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන

බමුණු මහසල් කුලයෙ රජනයෙන් ඉරී තැළුණු
මාන්දම් බිත්ති බඩ හේරා කොරපොතු ඉහෙන
ලොවට දුන් ගිනි ම යළි ගෙබිම ගිනියම් කරන
අලුත් වැස්සෙන් එගිනි නිවී නිවී සංසිඳෙන

එදා දස දිගින් වැඩි සුළඟට ද වැසු දොරින
ඇතුළු වෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලවුවේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටක් අත වනන (ලකුණු 16 යි.)

**2.** කථා රසය උද්දීපනය කිරීමෙහි ලා **සද්ධර්ම රත්නාවලී** කතුවරයා උපමා භාවිත කොට ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

"අතීත හා වර්තමාන කථා ඇතුළත් හේතු-ඵලවාදී කථා සම්ප්‍රදාය ජාතක කථාවලට අගනා සන්දර්භයක් ගෙන දෙයි." නියමිත කථා වස්තු ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

**3.** "පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙයි." **සද්ධර්මාලංකාරයේ** නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**4.** "රස නිෂ්පත්තියට යෝග්‍ය ආකාරයෙන් තෝරාගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීම නිසා **ගිරා සන්දේශය** සහෘදයාගේ සිත් ඇද ගනී." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**5.** "ලෝකයේ පවත්නා දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න හෝ මගින් ස්ත්‍රී පුරුෂයන් අතර ඇති වන ප්‍රේම සම්බන්ධතාවන්ට බාධාවක් ඇති නො වේ. එහෙත් ගැටලු පැන නගින්නේ විවාහය පිළිබඳ ප්‍රශ්නයේ දී ය." **මළගිය ඇත්තෝ** නවකතාව ඇසුරෙන් මේ මතය විභාග කරන්න. (ලකුණු 15 යි.)

**6.** **මාවතේ දරුවෝ** කෙටිකතාව මගින් දයාසේන ගුණසිංහ කාලීන සමාජ යථාර්ථය හෙළි කිරීමට දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

**7.** "කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ එක් ප්‍රධාන පරමාර්ථයක් වූයේ තම සහෘදයන් ජාතිකාභිමානයෙන් ඔදවත් කිරීම යි." කවීන් **දෙදෙනකුගේ** පද්‍ය නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**8.** පැරණි භාරතීය ප්‍රභූ සමාජයේ දුර්වලතා කලාත්මක ව නිරූපණය කිරීමෙහි ලා **රත්නාවලී** නාට්‍යයේ කතුවරයා දරන ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැයි නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/පිළිතුරු හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

WWW.ALEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් ශ්‍රමශක්තිය දියුණු කිරීම සහ උපයෝජනය පිළිබඳ සියලු ම මූලික ක්‍රියාවලීන්හි පදනම වනුයේ අධ්‍යාපනය යි. අධ්‍යාපනය මිනිස් ශ්‍රමශක්ති ඉල්ලුමෙහි සහ සැපයුමෙහි වර්ධනයට ඉවහල් වන ක්‍රම විවිධ මෙන් ම සංකීර්ණ ය. පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීමෙහි ලා අධ්‍යාපනය සතුව ඇත්තේ ඍජු කාර්යයකි. එමගින් මිනිස් ශ්‍රමශක්තිය මෙහෙයවීමෙහි සහ පතුරුවාලීමෙහි මෙන් ම නිපුණතාවන් ලබා ගැනීමෙහි ලා වූ මූලික පෙලඹීම් සාධක ක්‍රියාත්මක කෙරේ. අන් සෑම කරුණකට ම වඩා එමගින් මිනිස් විචල්‍යයන් ක්‍රියාත්මක ව සංස්කෘතික සහ සමාජ සැකැස්ම සැපයේ.

පොදු අධ්‍යාපන ක්‍රමයක් සතු කාර්යය ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම 'පුහුණු කළ හැකි' බවට පත් කරන මූලික අධ්‍යාපනික පසුබිමක් ඔවුනට ලබා දීම යි. ප්‍රාථමික අධ්‍යාපන තත්ත්වයේ දී පිළිබිඹු වන මෙම ප්‍රවීණතාව වුකලී අකුරු දැනීමෙහි වැඩි දියුණුව සඳහා වූ වෙනස පිළිබඳ අවබෝධයෙහි ප්‍රතිඵලය යි. ඇතැම් පර්යේෂකයන් විසින් මූලික අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර නියත අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇති බව පෙන්වා දී තිබේ. ද්විතීයික මට්ටමේ දී අධ්‍යාපනය, ලිපිකාර සහ අලෙවි කටයුතුවල නියුක්තවූවන් සහ ගුරුවරුන් යනාදි විශාල පුද්ගල සංඛ්‍යාවක් ඇතුළු පුහුණු කළ හැකි නා නා මාදිලියේ ශ්‍රමිකයන් බිහි කිරීමට ඉවහල් වනු පමණක් නොව, එහි අන්තර්ගත වෘත්තීය සහ විවිධීකෘත අංශ මගින්, නොයෙක් ශිල්පීන්ටත් පහළ ශ්‍රේණිවල පරිපාලකයන්ටත් අවශ්‍ය මූලික දැනුම ලබා දෙයි. පැහැදිලි වශයෙන් ම මධ්‍ය සහ ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය වනුයේ ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම යි. උසස් අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටෙහි ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩි වේ. මෙපරිද්දෙන්, සෑම මට්ටමක දී ම, අධ්‍යාපනික අවස්ථා, සමාජ සහ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවට සීමා නොකොට ම ඒ හා සම්බන්ධ කර ලීම වැදගත් බව පැහැදිලි ය.

(i) අධ්‍යාපනය සතුව ඇති ඍජු කාර්යභාරයක් වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ii) මූලික අධ්‍යාපන පසුබිම යනුවෙන් මේ ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?

(iii) ඇතැම් පර්යේෂකයන් විසින් දක්වනු ලැබ ඇති ආකාරයට අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර පවතින්නේ කෙබඳු සබඳතාවක් ද?

(iv) මධ්‍ය හා ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය කුමක් ද?

(v) උසස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස ලේඛකයා දක්වන්නේ කුමක් ද? (ලකුණු 10 යි.)

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අද බලවත් ම සමාජ ආයාචනය බවට පත්ව ඇත්තේ සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීම බව පැවසේ. එක්සත් ජාතීන් විසින් දස වසරින් දස වසර ලෝක සංවර්ධනයට තේමාවක් ලබා දෙන ලදි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන දශකවලින් විස්තර වන පරිදි 90 දශකයේ ලෝක සංවර්ධන උපාය මාර්ගවල එක් ප්‍රධාන ක්‍රමෝපායක් වූයේ තිරසර සංවර්ධනය කරා යන ගමන සඳහා ලෝක ජනතාව සූදානම් කිරීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පවරමින් තම සහාය ද ප්‍රදානය කිරීම යි.

සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය ම වෙයි. ඒ අනුව මානව සුබසාධනය ද පරිසර සුබසාධනය (සංරක්ෂණය) ද වැදගති. එයින් පෙනෙන්නේ පරිසරය සුරක්ෂණය කිරීම අවසාන වශයෙන් මානවයාගේ පැවැත්ම සනාථ කරන බව යි. ඒ අනුව සංවර්ධනයේ පරම අරමුණ මිනිසාගේ සුබසාධනය නම් 'පරම සම්පත' ද මිනිසා ම වනු නියති. එහි අනෙක් අන්තය නම් මිනිස් සම්පත සතු පරම සම්පත පරිසරය බව යි.

පාරිසරික වශයෙන් තිරසර වූත්, ආර්ථික වශයෙන් පවත්වා ගෙන යා හැකි වූත් සමාජීය වශයෙන් සර්ව සාධාරණ වූත් සංවර්ධනයක් ලබා ගත හැක්කේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ජනතාවට නැත. ජගත් සංවිධානවලට නැත. සැබවින් ම ඒ කවරකට වුව එම අදහසින් මිදිය හැකි ද නොහේ.

මානව සම්පත් සංවර්ධනය යනු විසින් අර්ථ ප්‍රමාණික කරනු ලබන්නේ පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික වශයෙන් ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි ලෝක ජනතාවක්, ලෝක ජන සමාජයක් බිහි කිරීම යි. (ලකුණු 15 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග
(ii) ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග
(iii) රුපියල අවප්‍රමාණය වීම මගින් මෙරට ආර්ථිකය කෙරෙහි ඇති වන බලපෑම
(iv) රටක සංහිඳියාව උදෙසා සංස්කෘතික උත්සව මගින් ලැබෙන දායකත්වය
(v) ප්‍රමාණාත්මක භාවයෙන් මෙන් ම ගුණාත්මක භාවයෙන් ද අධ්‍යාපනය අනූන විය යුතු ය.
(vi) සිංහල සිනමාව ජාත්‍යන්තර තලයට ගෙන ඒමේ අවශ්‍යතාව (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) සිරකරුවන් මනුෂ්‍යායෝ වෙති.
(ii) රජය විසින් නාවික හමුදාවට නවක සෙබළුන් බඳවා ගැනෙති.
(iii) මහතාහිමියන් කුලපති ධුරයෙන් පිදුම් ලැබූහ.
(iv) මැන්ඩිස් ගුණසේකර මුදලිතුමාණෝ භාෂා පරිවර්තකයකු මෙන් ම සාහිත්‍යධරයෙක් ද වූහ.
(v) ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයන් නොබෝදා දැයෙන් සමු ගත්හ. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ඇමතිතුමා සාහිත්‍යධරයන් අගය කරයි.
(ii) පක්ෂ ලේකම්වරු නගරසභාවලට අපේක්ෂකයන් නම් කළහ.
(iii) ආරක්ෂක භටයෝ නගරයේ දී අප පරීක්ෂා කළහ.
(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපිරිසිදු ආපණශාලා හිමිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරති.
(v) විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරු මා පැසසූහ. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) වාග්විද්‍යාඥයෝ නව භාෂා (රීතීන්/රීතීහු) විග්‍රහ කරති.
(ii) ඇමතිතුමා ශිෂ්‍යත්වලාභීන් කොළඹට (කැඳවයි/කැඳවති).
(iii) (දරුවෝ/දරුවන්) වියපත් වූ පියාණන් රැකබලා ගනිති.
(iv) ගුරුළුගෝමී විසින් ධර්මප්‍රදීපිකාව රචනා (කරන ලදි/කරනු ලබයි).
(v) (කිඹුලෝ/කිඹුලන්) ගම් වදිති'යි ගැමියෝ බියෙන් පසු වෙති. (ලකුණු 05 යි.)

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ජාතීන් අතර **අන්‍යෝන්‍ය** අවබෝධය ඉතා අගනේ ය.

(ii) අධිකරණය **චූදිතයා** නිදහස් කරයි.

(iii) චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ **දුරවබෝධ** පද නිතර හමු වෙයි. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) විද්‍යාව දැනගත් පුද්ගලයා

(ii) කෘතියක ගැටලු සහිත පද පහදා දෙන සාහිත්‍ය ග්‍රන්ථ

(iii) විචාර බුද්ධියෙන් තොරව කිසියම් මතයක එල්බ ගැනීම (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ඩෙංගු රෝගය මැඩීම සඳහා පාසල් ...................... පිරිසිදු ව තබා ගත යුතු ය.

(ii) අඩු මිල විදුලි ...................... නිෂ්පාදනයෙන් චීනය ඉදිරියෙන් සිටී.

(iii) අනුරාධපුර නගරයේ දී ගොවි ...................... පැවැත්විණි.

(iv) වීරෝදාර සෙබළු යුද්ධ ...................... වෙත අවතීර්ණ වූහ.

(v) ලෝක සාමය පිළිබඳ ජාත්‍යන්තර ...................... ජිනීවාහි දී පැවැත්වේ.

(vi) තාක්ෂණික ...................... මිනිසාගේ බුද්ධිබලය හීන කරයි.

(මෙවලම්, බිම, සම්මන්ත්‍රණය, භූමිය, සමුළුව, උපකරණ) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) භාණ්ඩයක **කල්** පැවැත්ම කෙරෙහි කවුරුත් අවධානය යොමු කරති.

(ii) **ලද** යන්නෙහි ලැබූ අර්ථය ඇත.

(iii) ඔහු සභික ධූරයකට **පත්** කෙරෙයි.

(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.

(v) සොරා **පැන** දුවයි.

(vi) යුද්ධය නිසා බොහෝ දරුවන්ට **පිය** සෙනෙහස අහිමි විය. (ලකුණු 06 යි.)

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) ප්‍රියයාගේ **වියෝගය** දරනු නොහැකි ව **මුවගන** තම **නුවනත** කඳුළින් පුරවා ගත්තා ය. (**වියෝගය** - උපසර්ග, **මුවගන** - සන්ධි, **නුවනත** - තද්ධිත)

(ii) වැද්දා **ඔබිනොබ සරන වනසතුන්** ඉලක්ක කර හීයක් විද්දේ ය. (**ඔබිනොබ** - සන්ධි, **සරන** - කෘදන්ත, **වනසතුන්** - සමාස)

(iii) **ජ්‍යෙෂ්ඨ** ශිෂ්‍යයන්ගේ නොමනා ක්‍රියා නිසා ඇතැම් **නවක ශිෂ්‍යයෝ** සරසවිය අත් **හැර** යති. (**ජ්‍යෙෂ්ඨ**-තද්ධිත, **නවක ශිෂ්‍යයෝ** - සමාස, **හැර** - ක්‍රියා)

(iv) **සුරාසුර යුද්ධයෙහි** දී පරාජය වූවෝ **දෙව්ලොව** හැර පලා ගියහ. (**සුරාසුර** - සන්ධි, **යුද්ධයෙහි** - විභක්ති, **දෙව්ලොව** - සමාස)

(v) "**අනේ!** එ විපත සිදු වුණි. නො **දනිමි කාගෙ** දොසා" (**අනේ** - නිපාත, **දනිමි** - ක්‍රියා, **කාගෙ** - විභක්ති) (ලකුණු 15 යි.)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) වැරදි කරන්නා කාටත් වැරදි කරයි.

(ii) තනතුරට වඩා හැසිරෙන ආකාරය වෙලාවක දී වටින්නේ ය.

(iii) තමාගේ දියුණුව තමා ම සලසා ගන්න.

(iv) වැඩ දෙකක් ම එකවර කර ගැනීම

(v) යහපත් දේ කළත් නපුරු මිනිසා යහපත් ගති ඇත්තෙකු නොවීම

(vi) කෙනෙකුගේ ගති ගුණ වෙනස් කළ නොහැකි වීම (ලකුණු 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

(ආ) පහත දී ඇති **රැකීවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) අමු කැවිලා (ii) අං මතුවෙලා
(iii) දෝරේ යනවා (iv) වැදි බණ
(v) දෙකට දෙවාරම් (vi) අකලට මෝරලා (ලකුණු 03 යි.)

(ඇ) පහත දී ඇති **එක් එක් යුගල පදය සැදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) දිග - පළල (ii) වං - හුං
(iii) බැළ - මෙහෙවර (iv) හයි - හක්තිය
(v) හැල - හැප්පුම් (vi) දෙගුණ - තෙගුණ (ලකුණු 03 යි.)

(ඈ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) දිය කැට පහණ (ii) කෝණම
(iii) තිහව (iv) පිරිවැස්ස
(v) ඇන්න යනවා (vi) රෑනා (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) තෙත්තෙ (ii) දහ අට ගොඳයි
(iii) මුදුනා (iv) පුබ්බරු
(v) බය්යනවා (vi) දෙයියන්ගේ බෝ්ව (ලකුණු 03 යි.)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චිත්‍රාකුමරියරූපයෙන්අග්‍රප්‍රාප්තයසියලුස්ත්‍රීමායමින්පාරප්‍රාප්තයමදමුදුලලිතභාෂණයෙන්දනෙත්කොන්බැල්මහා
මුසුවූමන්දස්මිතයෙන්දයෞවනයන්උන්මාදයටපත්කරනහෙයින්ඇඋන්මාදචිත්‍රානම්වූවායනෛමිත්තිකයන්
ගේඅනාවැකිඅසාභීතියටපත්දෙමවුපියන්විසින්ඇඑක්ටැම්ගෙයකසිරකරනුලැබූවායඅහෝඇදුක්මුසුවඑහිහුදකලා
වදිවිගෙවූවායඑකලගාමිණීනම්වූඅභිරූපසම්පන්නයෞවනයෙක්වූයේයඋත්තුංගදේහධාරියකුවූහෙයින්හෙ
තෙමදීඝගාමිණීනම්වීයදෛවෝපගතවමෙන්ඔවුන්දෙදෙනාඅතරප්‍රේමසම්බන්ධයක්ඇතිවියමාප්‍රේමියකෙදිනක
හෝඔබමාගේපාදපරිචාරිකාවකරගනිමියිඔහුඇයටපොරොන්දුවූයේයමාපෙම්බරකුමරාණමාගේඒකායනප්‍රාර්ථන
යදඑයමුත්මමමේසිරකුටියෙන්කෙසේමිදෙම්දැයිඇශෝකයෙන්බරවවිචාළායසොඳුරියමමඔබදකිනුපිණිසහැකිවිග
සින්එන්නෙමියිකියාඔහුඇයගේදර්ශනපථයෙන්ඉවත්වගියේයදිනසතිමාසගෙවීගියේයවසන්තකාලයදඋදාවියපූර්ණච
ත්ද්‍රයානභෝතලයශෝභාවත්කෙළේයපුලපුලාබලාසිටිරූපකායඇයඇස්මානයේපෙනීසිටියේයමුරසේවිකා
වක්අදරාත්‍රියේකුමරුන්ඔබවෙතඑතියිදැනුම්දුන්නායඔහුකක්කටකයන්ත්‍රයකකුළුවකුගේආකාරයෙන්තැනූයන්ත්‍රයක
ආධාරයෙන්එක්ටැම්කුලුනනැග්ගේයසඳවරින්වරවලාකුළුඅතරසැඟවගියේයඅරුණෝදයේළාහිරුරැස්ඔවුන
ගේකුටියආලෝකවත්කෙළේයඇහඬමින්මඳසුසුම්හෙළමින්නෙතුකඳුළින්පුරමින්ඔහුටසමුදුන්නාය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **ගෞරවාර්ථ ප්‍රත්‍යයක්** සහිත ආමන්ත්‍රණ පදයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) 'ක' වර්ගයට අයත් **ඝෝෂ මහාප්‍රාණ** අක්ෂරයක් සහිත පදය උපුටා ලියන්න.

(iv) **අස්ත්‍යර්ථයේ තද්ධිත** ප්‍රත්‍යය සහිත පද **දෙකක්** ඡේදයෙන් තෝරා ලියන්න.

(v) **දේහධාරියකු** යන්නෙහි ඇති පිල්ලම් නම් කරන්න.

(ලකුණු 15 යි.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.AlevelApi.com වෙත ...

www.AlevelApi.com

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 71 - සිංහල

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 71 - සිංහල I

### ලකුණු බෙදීයාම

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු ප්‍රශ්නය : මෙම ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ) යනුවෙන් කොටස් හයකින් සමන්විත ය.

| | | | |
|---|---|---|---|
| (අ), (ආ), (ඉ), (ඊ) | අවබෝධය | - | ලකුණු 16 (4 x 4 = 16) |
| (උ) | අවස්ථා සම්බන්ධය | - | ලකුණු 08 (2 x 4 = 8) |
| (ඌ) | රසාස්වාදය | - | ලකුණු 16 |
| | | | ලකුණු 40 |

අංක 02 සිට 08 දක්වා ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරින් 04කට පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි.

**I පත්‍රය සඳහා මුළු ලකුණු = 100කි.**

| | | |
|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම | : | I පත්‍රය 100 |
| | | II පත්‍රය 100 |
| අවසාන ලකුණු | : | 200 ÷ 2 = 100 |



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ........................................................ ✓ △ $\frac{4}{5}$

(ii) ........................................................ ✓ △ $\frac{3}{5}$

(iii) ........................................................ ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

- පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) සතරමහමුහුද පැන් විතරවත් බොහෝව' යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සේ ශෝකදුඃඛය තුනී විය. ශෝකදුඃඛය තුනී නියාව දැනලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු ය'යි වදාරා විසිවන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළසේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරවත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා ජාතින් ශුද්ධ කළහ. සංසාර දෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොවීසැපතට ලොවුතුරාසැපතුත් යම්තම් විතරක් ලත්හ.

   (i) පටාචාරාවන්ගේ ශෝකදුඃඛය තුනී වූයේ කෙබඳු ආකාරයෙන් ද?

   (ii) ශෝකදුඃඛය තුනී වූ පසු බුදුන් වහන්සේ පටාචාරාවට කුමක් වදාළ සේක් ද?

   (iii) පටාචාරා තම ජාතිය ශුද්ධ කර ගත්තේ කෙසේ ද?

   (iv) **නටුවා වූ** හා **ලොවිසැපත** යන වචනවල අර්ථ සපයන්න. , (ලකුණු 04 යි.)

(i) මුවහත් තබන්නා වූ යකඩයක මලකඩ ඉවත් වන්නා සේ/නැති වන්නා සේ

(ii) දෙමාපිය ආදි අය මිය පරලොව යන්නා වූ තැනැත්තන්ට තමා ජීවත් ව සිටිය දීත් පිහිට විය නොහැකි වෙති. නුවණැති අය ශීලය පිරිසිදු කරගෙන තමතමන්ට පිහිට සලසා ගත යුතුය.

(iii) බොහෝ කෙලෙසුන් දුරු කොට සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා

නටුවා වූ- නෂ්ට වූ/විනාශ වූ/නැසුණා වූ/නැසී ගිය/නැසී ගියා වූ/නැති වූ

(iv) ලොවී සැපත - ලෞකික සම්පත්තිය / ලෝකයේ පවත්නා සැප සම්පත් / ලෝකයට අයත් සැප සම්පත්

(ආ) එකල්හි රජ කරන සොත්ථිසේන රජ්ජුරුවෝ තමන් හා එක් ව දුක් ගෙන ඇවිදි සම්බුලාවන්ට අග මෙහෙසුන් තනතුරු පමණක් දී සෙසු නිසි වෘත්තියක් නුදුන්නාහ. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ඇති බවත් නො දැන තෙසු ස්ත්‍රීන් හා සමග සිත් අලවා කෙළිමින් සෙමින් අභිරමණය කොට ඇවිදිනාහ. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් දුර්වල ව පඬුවන් සිරුරු ඇති ව ඉපිල හුණු නහර බහනින් වෙළඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ. ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති ඒ බිසව් එක් දවසෙක්හි රජ ගෙන් දන් අනුභව කරන්ට ආ මයිල් රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්නීය. එකල්හි තාපසයෝ ඉතා ම දුර්වල ව ශරීරයක් ඇති මිරිකුණා වූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දැක, දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියත්.

   (i) සොත්ථිසේන රජ තමන් හා එක්ව දුක්ගෙන ඇවිදි සම්බුලාවන්ට කෘතගුණ දැක්වූයේ කෙසේ ද?

   (ii) බිසව ශෝකයෙන් දුර්වල වූයේ ඇයි?

   (iii) රජතුමා සෙසු ස්ත්‍රීන් සමග සිත් අලවා විසීම කතුවරයා ඉදිරිපත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද?

   (iv) **මයිල්** හා **ඉඳුරන්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(i) සෙසු නිසි වෘත්තියක් නොදී අගබිසව් තනතුර පමණක් දී

(ii) තමන් කෙරෙහි නිසි විචාරයක් නොමැතිවීම නිසා දවසින් දවස ලැජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් / සපත්නීරෝෂයෙන් දුර්වල ව

(iii) බිසවුන් ඇති බවක් වත් නොදැන වෙනත් කාන්තාවන් සමඟ සිතින් බැඳී ඔවුන් හා සිනා සෙමින්, අභිරමණය කෙරෙමින්

(iv) මයිල්- මාමා/මාමණ්ඩි/මයිලණුවන්

ඉඳුරන්- ඉන්ද්‍රියයන් (ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියයන්)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නො ලැබ තෙරුන්වහන්සේගේ සමීපයට ම යෙමි යි සිතා විහාරයට ගොස් "ස්වාමීනි, ගැත්තවුට පිටිවහල් වුව මැනව, මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඔහු දැක කම්පා ව ළය පිරුණු ශෝක ඇති ව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු උණු පැනින් නහවා කුලාවෙන් තෙල් ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් තවමින් උන් කල්හි ඊහට බැටදුන් උපාසකයා උදෑසන්හි ම සොරා කොයි ගියේ දෝ හොයි විචාර විචාරා සොයා ඇවිදුනේ විහාරයට ගොස් සොරා පිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දැක ඔබ හා සමග කථා කරන්නා වූ උපාසක තෙම,

(i) සොරා විහාරයට ම ගියේ ඇයි?
(ii) විහාරයට පැමිණි සොරා තෙරුන්වහන්සේට කුමක් පැවසුවේ ද?
(iii) විහාරයට ගිය උපාසකයාට දක්නට ලැබුණේ කුමක් ද?
(iv) **පිටිවහලක්** හා **උනා ගෙන** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

(i) ගම හැම තැන ම/ගම පුරා/ගම මුළුල්ලෙහි ඇවිද පිටිවහලක්/උපකාරයක්/පිළිසරණක්/පිහිටක් නො ලැබුණු නිසා

(ii) ස්වාමීනි, අසරණ වූ තැනැත්තාට පිටිවහල් වුව මැනවි. මේ පිට බැඳි මළමිනිය ඉවත් කර මාහට පිහිට වන්නැයි පැවසී ය.

(iii) තෙරුන්වහන්සේ සොරාගේ පිටෙහි තෙල් ගල්වා තවමින් සිටි අයුරු/සොරාගේ පිටෙහි තෙල් ගා තවමින් තෙරුන්වහන්සේ සිටින ආකාරය

(iv) පිටිවහලක් - උපකාරයක්/පිළිසරණක්/පිහිටක්/උදව්වක්
උනා ගෙන - ගලවා ගෙන/ලිහා ගෙන/ඉවත් කර ගෙන

(ඊ) නොසී කරන මිසදිටුවන් බස් අබඳ
නි සී නැණැති සිරි පැරකුම් රජුට නඳ
ර සී ගැඹුරු තෙපලෙන් සැක සිත පසිඳ
දෙ සී සුවාසූ දහසක් දහම් කඳ

එ හිමි කෙලෙස් ගිරි මුදුනින් වැහෙන සොඳ
දහම් අහස් ගඟ දූල දිය දහර වැද
නොමඳ සතොස් අම ඔදසින් පිරි නිබඳ
බැබැළි වෙසෙස් නරනිඳු සඳ කිරි මුහුද

(i) පැරකුම් රජතුමාට නිසි නැණ ඇතැයි කවියා පවසන්නේ කුමක් නිසා ද?
(ii) නරනිඳු සඳ කිරි මුහුද වෙසෙසින් බැබළුණේ ඇයි?
(iii) 'දහම් අහස් ගඟ' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iv) **සුවාසූ දහසක් දහම් කඳ** යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 04 යි.)

(i) මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ අසම්බන්ධ වචන සිහි නොකරන නිසා

(ii) ඒ ස්වාමීන් වහන්සේ නමැති කෙලාස පර්වත මුදුනෙන් වෑහෙන මනාවූ ධර්මය නමැති ආකාශ ගංගාවේ බබළන දිය දහර වැදීමෙන්

(iii) රූපකාලංකාරය

(iv) අසූහාර දහසක් ධර්මස්කන්ධය/අසූහතර දහසක් ධර්මස්කන්ධය

* ජේදයේ ඇතුළත් වචන වෙනුවට ව්‍යවහාරයේ පවතින සම්පාර්ථවත් වෙනත් වචන ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
   (i) "සෙසු වුවමනා දවස් නැති හෙයින් අදම වුවමනා ද?"
   (ii) "ස්වප්නයෙන් දැකීම් වශයෙන් මහත් දොළක් උපන්නේ ය."
   (iii) "ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනකැයි සිතමි."
   (iv) "අපේ ගෙවල් ඔක්කොම පිළිස්සුණා යුද්දෙදි"
   (v) "රජතුමනි කලබල වෙන්ඩ එපා"
   (vi) "ගුණවතී .... ලොකු පුතා ද කෙඳිරි ගෑවේ?" (ලකුණු 08 යි.)

(i) සද්ධර්ම රත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටුවරයාගේ කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. කබලුපූවක් කනු කැමති ව එහෙත් වස්තුව වියදම් වෙති'යි සිතා කිසිවකුට එය නො කියා සිටුවරයා ඇඳෙහි වැතිර සිටි අවස්ථාවේ දී සිටුදේවිය ඇසූ ප්‍රශ්නයකට සිටුවරයා විසින් (සිටුදේවියට) ප්‍රකාශ කරන ලදි.

(ii) ජාතක කථා පොතෙහි අන්තර්ගත ඡද්දන්ත ජාතකයෙන් උපුටා ගත් පාඨයකි. චුල්ලසුභද්‍රා ව්‍යාජ ලෙස රෝගී ව ඇඳෙහි වැතිර සිටි අවස්ථාවේ දී බරණැස් රජු විසින් ඒ පිළිබඳ විමසූ විට චුල්ලසුභද්‍රා විසින් රජුට ප්‍රකාශ කරන ලදි.

(iii) සද්ධර්මාලංකාරයෙහි සාලිරාජ කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. අශෝකමාලා දේවිය පිළිබඳ බමුණන්ගෙන් තොරතුරු අසා දැන ගත් දුටුගැමුණු රජ අශෝකමාලා දැකීමට එන බව සාලිරාජ කුමරුට දන්වා යැවූ අවස්ථාවේ කුමරා විසින් අශෝකමාලා දේවියට ප්‍රකාශ කරන ලදි.

(iv) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටා ගත් පාඨයකි. දෙවෙන්දොරා සං කියෝතෝවට යාමට පෙර යොත්සුයාහි මොමොකෝගේ නිවසට යන අතරමග දී යුද්ධයට පෙර තමන් මෙහි විසූ බව නොරිකෝ පැවසූ විට "මෙහෙන් ගියේ ඇයි ද"යි දෙවෙන්දොරා සං ඇසූ අවස්ථාවේ දී නොරිකෝ සං විසින් ඔහුට ප්‍රකාශ කරන ලද්දකි.

(v) රත්නාවලී නාට්‍යයෙන් උපුටා ගත් පාඨයකි. අන්තඃපුරය ගිනි ගනිමින් තිබූ අවස්ථාවේ දී එහි දම්වැලෙන් බැඳ දමා සිටි සාගරිකා බේරා ගන්නා ලෙස වාසවදත්තා බිසව උදයන රජතුමාගෙන් ඉල්ලා සිටි විට රජු ගින්න වෙත යාමට සූදානම් වූ අවස්ථාවේ දී විදූෂක (වසන්තක) විසින් රජුට ප්‍රකාශ කරන ලදි.

(vi) ඒ. වී. සුරවීර මහතාගේ "තමන්ගේ දරුවෝ" කෙටිකතාවේ ගුණවතී කන්කැක්කුම සෑදී කෙඳිරිගානු ඇසී, ඒ හඬ තම පුතුගේ ය'යි සිතූ ලොකුහාමිනේ විසින් ගුණවතීට ප්‍රකාශ කරන ලදි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඌ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පරපුරක කළු දුඹුල් කඩා පිරිසුදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිතින
මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින

ඇඳුරු වුණු දොර ජනෙල මානයේ උණුසුම්න
සුව සිහිල නිදහසේ උරා බී සැප විඳින
ලෝකයේ පුස්ඹ පිරි තිරෙන ලෙස විවර වුණ
වලවුවට සිවු දිගින් සුළං රැලි විත් නටන

අලුත් වැස්සෙන් පෙඟුණු පින්තූරයෙන් එබෙන
රත් යවට සේ දැවෙන හාත්තාගෙ නෙත් වලින
දීප්තිය නිවී සේදී දූකට කඳුළු එන
රාමුවෙන් බිඳෙත් බිඳ පතිත වී ලිහී යන

ඇතුළු ගැබ නොදුටු අහුමුලු සොයා හඹායන
අලුත් වැහි හැලි වළං උතුරුවා ඇද වැටෙන
මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන

බමුණු මහසල් කුලයෙ රස්නයෙන් ඉරි තැළුණ
මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන
ලොවට දුන් ගිනි ම යළි ගෙබිම ගිනියම් කරන
අලුත් වැස්සෙන් එගිනි නිවී නිවී සංසිඳෙන

එදා දස දිගින් වැඩි සුළඟට ද වැසූ දොරින
ඇතුළ වෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලවුවේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන

(ලකුණු 16 යි.)

වැඩවසම් සමාජයේ ඇතැම් ලක්ෂණ බිඳවැටීම හා නව සංස්කෘතියක පිබිදීම මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂය වී තිබේ. වලවුවට පැමිණි වැස්සක් මුල්කොට ගනිමින් සංක්‍රාන්තිමය අවස්ථාවකට ප්‍රවේශය ලබා ගන්නා කවියා, සමස්ත කාව්‍ය නිර්මාණයෙන් ම නිරූපණය කරන්නේ පහළ ගැමි සමාජ ස්තරය පීඩනයට ලක් කළ ගතානුගතික වැඩවසම් සමාජ ක්‍රමය පරිහානියට පත්වන ආකාරය යි.

වලවුවේ ප්‍රභූවරුන්ගේ දුෂ්ටත්වයෙන් හා බලකාමීත්වයෙන් පරිපීඩිත වූ ජනයා ලබන ආධ්‍යාත්මික වූත්, භෞතික වූත් නිදහස අලුත් වැස්සෙන් සංකේතවත් කෙරෙන අතර එය කාලාන්තරයක් තිස්සේ සමාජය ප්‍රාර්ථනා කළ දෙයක් බව ද කියැවේ. මෙහි විශේෂත්වය වන්නේ පැරණි ප්‍රභූ සමාජයේ තරුණ පරම්පරාව නියෝජනය කරන කථකයා ද මෙම පරිවර්තනය හමුවේ උද්දාමයට පත් ව සිටීම යි.

"මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින "
යන්නෙන් ධ්වනිත වන්නේ ඔහු තුළ ඇති වන ප්‍රහර්ෂය යි.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

අද්දැකීම ප්‍රතිනිර්මාණය කිරීම සඳහා කවියා සංකේතාර්ථ, රූපකාර්ථ හා ධ්වනිතාර්ථ මුසු වූ සංක්ෂිප්ත භාෂාවක් යොදා ගනියි.

නිදඃ- "පරපුරක කළු දුඹුල් කඩා පිරිසුදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින"

"දැදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
සුව සිහිල නිදහසේ උරා බී සැප විඳින"

"රත් යවට සේ දැවෙන තාත්තාගෙ නෙත් වලින"

"මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන"

"මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන"

"වලවුවේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන"

අද්දැකීමට උචිත උපමාරූපක භාවිතය මගින් වාක් චිත්‍ර මැවීමට සමත් වන කවියා, නිදහසේ ප්‍රමෝදය සමස්ත කාව්‍යය පුරා විහිදුවා ලයි. එමගින් ගතානුගතිකත්වය ප්‍රතික්ෂේප කරන ප්‍රගතිශීලී ජීවන දෘෂ්ටියක් සහෘදයා වෙත ආරෝපණය කෙරෙයි.
ඉහත කරුණු ඇසුරු කර ගනිමින් රසාස්වාදය ලිවීම අපේක්ෂා කෙරේ.

**2.** කථා රසය උද්දීපනය කිරීමෙහි ලා **සද්ධර්ම රත්නාවලී** කතුවරයා උපමා භාවිත කොට ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

"අතීත හා වර්තමාන කථා ඇතුළත් හේතු-ඵලවාදී කථා සම්ප්‍රදාය ජාතක කථාවලට අගනා සන්දර්භයක් ගෙන දෙයි." නියමිත කථා වස්තු ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

සද්ධර්ම රත්නාවලියේ නියමිත කථා වස්තු ඇසුරෙන් කථා රසය උද්දීපනය කිරීම සඳහා කතුවරයා උපමා යොදා ගත් ආකාරය පැහැදිලි කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි දී අවස්ථා, චරිත, පරිසරය හා චෛතසික ස්වභාවය නිරූපණය සඳහා උපමා යොදා ගත් ආකාරය පිළිතුරෙන් පෙන්වා දී තිබිය යුතු යි. ඒ සඳහා යොදා ගත හැකි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

★ සිටු දියණියන් සිටු මැඳුරෙන් පලා යාමට සැරසෙන අවස්ථාව මෙන් ම එම චරිතයේ ඇති වංචනික සහ දැඩි ස්වරූපය ද අනාවරණය කෙරෙන ආකාරයේ උපමා මාලාවක් යෙදීම.
"සිටු දුවණියෝ ද දෙවන දවස් කිලුටු අදහස් සේ ම කිලුටු කඩරෙද්දක් කොයින් දෝ සොයා හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන රෑ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන්...."



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

★ සිටු දියණියන් දෙමාපියන්ගේ නිවසට යන අතරමග අනපේක්ෂිත ලෙස දෙවන දරුවා ලැබීමට ආසන්න වන අවස්ථාව පරිසර සිද්ධීන් හා සම්බන්ධ කරමින් ඇයගේ කායික මානසික වේදනාවන්හි තීව්‍රතාව ශ්‍රාවකයාට කරුණ රසයෙන් යුක්ත ව විඳ ගත හැකි ආකාරයේ උපමා යොදා ගැනීම

"ඒ වේලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන, ආස ගුගුරන්නා සේ හඬගසන්නටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසවදුකුත් බෝ විය."

★ මච්ඡරිය කෝසිය සිටාණන්ගේ මසුරුකම පැහැදිලි කිරීමේ දී එය ප්‍රබල ලෙස ශ්‍රාවකයා හට දැනවීම සඳහා උපහාස රසයෙන් අනූන උපමා යෙදීම

" තණඅග ගලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට දීලත් නම් සිතට දුක් බලවත් හෙයිනුත්, නොලබන දුක්පතුන් සේ ම ... අනුන්ට දී නොලන හෙයිනුත් තමන් ප්‍රයෝජන නොවිඳිනා හෙයිනුත් උන් ලද සම්පත නම් රකුස්සන් තමන් නොබොන හෙයිනුත් අනුන් බිය නොදෙන හෙයිනුත් රකුසු රකවල තුබූ විලක් වැන්න."

★ මච්ඡරිය කෝසිය කථාවේ මුගලන් තෙරුන් කවුළුදොර කෙරේ වැඩ හිඳිනා අවස්ථාවේ ශ්‍රාවකයාගේ කුතුහලය තීව්‍ර වන ආකාරයට තෙරුන් වහන්සේගේ ප්‍රාතිහාර්ය පෑම හා සිටාණන් තුළ ඇති වන කැලඹීම උචිත උපමා මගින් නිරූපණය කිරීම

"සියලු මාලිගාව දුම්ගෙයක් සේ විය, සිටාණන්ගේ ඇසට දුම් වැදලා කබලු මඳ හෙයින් හඬන්නා සේ...."

★ සිටාණන් තුළ ඇති වන ආශාව ඇඹේණියන් හට පැවසීමට ඇති මැළිකම කෙතෙක් දැයි පැහැදිලි කිරීමට උචිත උපමා යෙදීම

"රළු දෙයක් සපා දුක සේ ගලන පරිද්දෙන්"

"කෙසිවිදට මහත් දෙයක් කෙසිවිදකින් අදනා කලක් පරිද්දෙන්"

මීට අමතර ව පිළිතුර සඳහා උචිත වෙනත් නිදසුන් ද දැක්විය හැකි ය.

www.alevelapi.com

නැතහොත්

නියමිත ජාතක කථා ඇසුරු කර ගනිමින් හේතුඵලවාදී කථා සම්ප්‍රදාය ඒවාට ඇතුළත් වන ආකාරය විස්තර කිරීම මෙන් ම එමගින් අගනා කථා සන්දර්භයක් ඇති වන ආකාරය පිළිතුරෙන් පැහැදිලි විය යුතු ය.

ජාතක කථාවල වර්තමාන, අතීත, ගාථා, වෙය්‍යාකරණ, සමෝධාන යනුවෙන් අංග කිහිපයකි. අතීත කථාවේ ඵලය වර්තමාන කථාව වේ. එය පැහැදිලි කෙරෙන්නේ ගාථාවෙනි. සමෝධානය මගින් අතීත වර්තමාන කථාවල සම්බන්ධය ඇති කෙරේ. හොඳ දේ නිසා යහපත් ප්‍රතිඵල ද නොහොඳ දේ නිසා අයහපත් ප්‍රතිඵල ද ලැබෙන ආකාරය මෙම කථා මගින් පෙන්වා දේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

උදා :-

ඡද්දන්ත ජාතකය - වර්තමාන කථාවේ දී බුදුන් වහන්සේගේ අලංකෘත අත්මභාවය දකින මෙහෙණියන්ට ජාතිස්මරණ ඥානය පහළ වෙයි. ඉහත ආත්මයක දී මෙම උත්තමයාට කළ සැහැසිකම් මතක් වේ. එනිසා ඇය හඬා වැටීම හේතු කොට ගෙන බුදුන් වහන්සේ විසින් අතීත කථාව දේශනා කෙරේ. එම කථාව තුළ ද සිදුවීම් විකාශනය හේතුඵල සම්බන්ධතාවෙන් යුක්ත ව ශ්‍රාවක පාඨක විශ්වසනීයත්වය දිනා ගන්නා ආකාරයට සිදු වී තිබේ.

ගණ්ඩතින්දු ජාතකය -

බුදුන් වහන්සේ කොසොල් රජුට කරන අවවාදයක් ලෙසින් ගණ්ඩතින්දු ජාතකය ඉදිරිපත් කර තිබේ. රජදරුවන් සියලු සත්ත්වයන් කෙරෙහි සර්ව සාධාරණ විය යුතු ආකාරය පැහැදිලි කිරීමට යොදා ගන්නා අතීත කථාවෙහි පඤ්චාල රජු රාජ්‍ය විචාරීමෙහි ප්‍රමාද ව කටයුතු කිරීම නිසා රාජ්‍යත්වයෙන් පිරිහෙන ආකාරයත්, ඔහු පිළිබඳ ව ජනතාවගේ අප්‍රසාදයත් ඉදිරිපත් කෙරෙන්නේ හේතුඵලවාදී කථා වින්‍යාසයක් සහිත ව ය.

සම්බුලා ජාතකය -

මල්ලිකා දේවියගේ පතිවත රැකීමේ සද්ගුණය පැහැදිලි කිරීමට අතීත කථාව දේශනා කෙරෙන අතර, එමගින් ද පැහැදිලි කෙරෙනුයේ පුද්ගලයකුගේ චරිත ස්වභාවය කර්මානුරූපී ව භවයෙන් භවයට ගමන් කරන ආකාරය යි. මෙහි වර්තමාන කථාවේ මල්ලිකා දේවිය අතීත කථාවේ සම්බුලා දේවිය යි. හේතුඵල සම්බන්ධයට අනුකූල ව අතීත කථාවේ ද චරිත, අවස්ථා, සිද්ධි නිරූපණය කෙරේ.

දේවධර්ම ජාතකය -

බහු භාණ්ඩික භික්ෂුව සසුනෙහි පිරිහෙන්නට ඉඩ නො දී අල්පේච්ඡ හා සන්තුෂ්ට භාවයෙහි ද, වීර්යය වැඩීමෙහි ද අනුහස් ප්‍රකාශ කරනු පිණිස පෙර ආත්මභාවයක එම භික්ෂුව දිය රකුසකු සේ ඉපිද දොළොස් වසරක් පුරා ලජ්ජා, භය දෙක සොයමින් කටයුතු කළ ආකාරය බුදුන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල සම්බන්ධතාව අනාවරණය වන පරිදි ය.

**3.** "පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙයි." **සද්ධර්මාලංකාරයේ** නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

සද්ධර්මාලංකාරයේ කථා වස්තු මගින් පැහැදිලි කෙරෙනුයේ පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙන ආකාරය යි.
මෙම පිළිතුර ලිවීම සඳහා පහත දැක්වෙන කරුණු යොදා ගැනීම යෝග්‍ය වේ.

සාලිරාජ වස්තුව -

තිස්ස නැවෑමියා දන්දීමට ඇති දැඩි කැමැත්ත හේතුවෙන් අත්පත් කර ගන්නා පුණ්‍ය ශක්තියට අනුව ඊළඟ ආත්මයේ දී දුටුගැමුණු රජුගේ පුත් ව ඉපදීම හා මහත් ආශ්චර්ය ලොවට පහළ කිරීම

උදා :- "ඔවුන් මව්කුසින් බිහිවීම හා සමග සියලු ලංකාද්වීපයෙහි එක පැහැර සුවඳ රත්හැල් වර්ෂා කළේ ය."



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

★ අශෝකමාලා බෝ මළුව ඇමදි කුසලයෙන් යහපත් වූ රූප සම්පත්තියක් ලැබ පූර්ව වාසනා බලයෙන් සාලිරාජ කුමරුට මෙහෙසිය වීම හා ආත්ම දමනය හේතුවෙන් දුටුගැමුණු රජුගේ ආශිර්වාදය ලබා ගැනීම

★ ඔවුන් දෙදෙනාගේ ආත්ම දමනය හේතුවෙන් සංවර වූත්, සමගි සම්පන්න වූත්, පවුල් දිවියක් ගත කිරීම හා දන් දී කුසල් රැස් කිරීමේ පුණ්‍ය ශක්තියෙන් ජීවිතාවසානයෙහි තුසිත භවනෙහි ඉපදීම

ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුව :-

★ ආත්ම දමනයෙන් හා කුසල් කිරීමෙන් වියුක්ත වීම හේතු කොට ගෙන හරන්තික මෙලොව දී ම නොයෙක් වධබන්ධනයට ලක්වීම

උදා :- ''මතු මෙසේ වූ සොර කමක් කෙරෙයි ද නොකෙරෙයිදැ'යි කිය කියා අතින් පයින් ඔහු තළා දුර්වල කොට අමුසොහොනකට ඇදගෙන ගොස්....''

★ අභය තෙරුන් වහන්සේ තම ආත්ම දමනය හේතුවෙන් සොරාට උවටැන් කිරීම හා උපාසකයාට අනුශාසනා කිරීම

''චණ්ඩ පරුෂ නීචගුණ ඇති යම් කිසි බල්ලෙක් සත්පුරුෂ ගුණ ඇති යමක්හුගේ පය කඩා කෑයේ වී නම් ඒ මිනිසා නැවත....''

★ හරන්තික ඇති කර ගන්නා ආත්ම දමනය හේතුවෙන් සසුන්ගත වීම හා අප්‍රමාද ව භාවනා කිරීමේ ශක්තියෙන් රහත් භාවයට පත්වීම

**4.** "රස නිෂ්පත්තියට යෝග්‍ය ආකාරයෙන් තෝරාගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීම නිසා **ගිරා සන්දේශය** සහෘදයාගේ සිත් ඇද ගනී." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී යටත් පිරිසෙයින් වර්ණනා දෙකක් වත් තෝරා ගෙන කරුණු දැක්වීම අපේක්ෂා කෙරේ. එසේ කරුණු දැක්වීමේ දී තෝරා ගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීමත්, ඒවා රස නිෂ්පත්තියට යෝග්‍ය වන ආකාරයෙන් දක්වා තිබීමත් අවශ්‍ය ය.
රස නිෂ්පත්තිය ඇති කිරීමේ දී කවියාගේ පරිකල්පනය, ශබ්දාර්ථ රසයන් සුසංයෝග කර ඉදිරිපත් කර ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.
මෙහි දී යොදා ගත හැකි වර්ණනා කිහිපයක් පහත දැක්වේ.

වන වැනුම :- වනාන්තරයක දක්නට ලැබෙන පරිසරය පිළිබඳ ස්වාභාවික චිත්‍රයක් මැවෙන ආකාරයෙන් හා සරල බස් වහර, විරිත් භාවිතයේ විවිධත්වය යනාදියෙන් රසිකයා තුළ රස නිෂ්පත්තිය සිදු කිරීමට කවියා සමත් වේ.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සැඳෑ වැනුම :- සඳ පායා ඒමේ අපූර්වත්වය, උචිත උපමා, රූපක භාවිත කරමින් වාක් චිත්‍රයට නඟා තිබේ.

අම්බලමේ කතා :- කටවහරට යෝග්‍ය වන අකාරයෙන් සරල, සංවාදාත්මක ස්වරූපයෙන් මෙහි පද්‍ය ඉදිරිපත් කෙරෙන්නේ රසිකයාගේ සුඛාවබෝධයට ඉවහල් වන පරිදි ය.

දියකෙළි වැනුම :- දිය කෙළියේ යෙදෙන කාන්තාවන්ගේ හැසිරීම් රටාවන් හා දක්ෂතා ඔවුන්ගේ සුන්දරත්වය, ගඟෙහි මැවෙන අසිරිය හා බලා සිටින ජනයාගේ ආකර්ෂණය වැනි කරුණු මගින් වර්ණනාවේ කලාත්මක අගය ඉහළ නැංවේ.

තොටගමු වෙහෙර වැනුම :- තොටගමු වෙහෙර අවට ප්‍රදේශයේ ඇති සෞන්දර්යය හා සාමණේරවරුන්ගේ කාරුණික චර්යාවන් ද කවියා වර්ණනා කරන්නේ රසිකයාගේ චිත්තාකර්ෂණයට ඉවහල් වන පරිදි ය.

පිරිවෙන් වැනුම :- කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ තොරතුරු කවියා ඉදිරිපත් කරනුයේ ශබ්දාර්ථ දෙක්හි සුසංයෝගයෙනි. එය රසිකයාගේ රස නිෂ්පත්තියට හේතු වේ.

මේ හැර පුර වැනුම, රජ වැනුම, මග වැනුම ආදි වෙනත් වර්ණනාවලින් ද උචිත නිදසුන් ඉදිරිපත් කළ හැකි ය.

**5.** "ලෝකයේ පවත්නා දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න හෝ මගින් ස්ත්‍රී පුරුෂයන් අතර ඇති වන ප්‍රේම සම්බන්ධතාවන්ට බාධාවක් ඇති නො වේ. එහෙත් ගැටලු පැන නගින්නේ විවාහය පිළිබඳ ප්‍රශ්නයේ දී ය." **මළගිය ඇත්තෝ** නවකතාව ඇසුරෙන් මේ මතය විභාග කරන්න. (ලකුණු 15 යි.)

දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න මගින් ස්ත්‍රී, පුරුෂ ප්‍රේමයට බාධාවක් ඇති නොවන බව මළගිය ඇත්තෝ නවකතාවේ ප්‍රධාන චරිත වන දෙවෙන්දොරා සං හා නොරිකෝ සංගේ චරිත ක්‍රියා කරන ආකාරයෙන් පැහැදිලි කළ හැකි ය. වෙනත් පෙම්වතුන් මෙන් ඔවුහු ද විවිධාකාරයෙන් ප්‍රේමයේ දුක සතුට වින්දනය කරති. එහෙත් විවාහය පිළිබඳ තීරණාත්මක අවස්ථාවක දී ඔවුන් මුහුණ පාන්නේ විසඳා ගැනීමට අසීරු ගැටලුවකට ය. එහි ස්වරූපය පිළිබඳ කරුණු පිළිතුරට අන්තර්ගත විය යුතු අතර, එහි දී අවධානය යොමු කළ හැකි කරුණු කිහිපයක් පහත දැක්වේ.

★ දෙවෙන්දොරා සංගේ චරිතය තුළ ඇති අස්ථාවර හා ආත්ම විශ්වාසයෙන් තොර ස්වභාවය

උදා :- ''ඇය මා හා විවාහ වී කවර රටක ජීවත් වන්ට ද කියාවත් මම නොසිතුවෙමි.''

''අඳුරු වූ අනාගත මාර්ගය අපට මොහොතකටවත් පෙන්වා දෙන මෙන් මම නකජිමා සංගේ මළගිය ආත්මයෙන් අයැදීමි''



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

''මං දන්නේ නෑ. මම ගියායින් පස්සේ, ආයෙමත් හොඳට කල්පනා කරලා බලන්න. මං ඉන්න කල් අමාරුනේ තීරණය කරන්න. එහේ ගිහිල්ලා අපට වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවන් වේවි ද?''

''අවට සෙවනැලි අතරින් නොරිකෝ මතු ව එනු පෙනේ.... මම අවට බලමි. තතමි පැදුරු මෙහි නැත. ....මෙහි දී නොරිකෝගේ ආචාරශීලය ශෝභන වීමට ඉඩ නැත. එය හාස්‍යජනක වන්ට ද පුළුවන.''

★ නොරිකෝ සං විවාහය කෙරේ දැඩි ලෙස අපේක්ෂා සහගත වීම හා ජපන් සංස්කෘතියෙන් බැහැර වීමට ඇති අකැමැත්ත

''කිසිම දෙයක් පිළියෙල නොකර ඔබ අහනව මම එන්නෙ කවදා ද කියා. මම කොහොම ද එහෙම එන්නෙ? පළමුව ඔබ ඇවිත් මා සමඟ විවාහ වෙන්න ඕන.''

''ඇත්ත වශයෙන් ම මගේ සිතත් දෙගිඩියාවේ ක්‍රියා කරනවා. ඔබ මෙන් මම ද අනාගතය සකස් කර ගැනීමට දක්ෂ නැත. ඔබට මෙහේ ඇවිත් මා සමඟ විවාහ වන්නට බැරි ද? ... මම කවදා නමුත් අම්මයි තාත්තයි වාසය කරන නකජිමා සොහොනට ඇතුල් වෙන්න කැමතියි.''

මේ හැර පිළිතුර සඳහා ගැළපෙන වෙනත් නිදසුන් ද ලිවිය හැකි ය.

6. **මාවතේ දරුවෝ** කෙටිකතාව මගින් දයාසේන ගුණසිංහ කාලීන සමාජ යථාර්ථය හෙළි කිරීමට දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

මෙම පිළිතුරෙන් සමකාලීන සමාජ යථාර්ථය කෙටිකතාකරුවා ඉස්මතු කරන ආකාරය දැක්වීම අපේක්ෂා කෙරේ.
අප දකින සමාජය තුළ මිනිසා හැසිරෙන ස්වරූපය මිනිසාගේ සැබෑ ස්වරූපය ම නො වේ. එය හුදෙක් බාහිරින් මවාගත් ලෝකයකි. ඒ මවාගත් ලෝකය තුළ නොපෙනෙන සමාජ යථාර්ථයක් ද වෙයි. එය සැබෑ යථාර්ථය ම වන්නේ ය. එය ඉස්මතු කිරීමට කෙටිකතා රචකයා උත්සුක වූ ආකාරය පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරින් පිළිතුර සකස් විය යුතු ය.

i) වීදි දරුවන්ගේ ජීවිතය හා බැඳුණු සමාජ යථාර්ථය
ඒ යටතේ;

★ එම දරුවන්ගේ ජීවිතවල ඇති අවිනිශ්චිත ස්වභාවය
★ ඔවුන්ගේ දූදරු දෙමාපිය සම්බන්ධතාවෙහි දුරස්ථභාවය



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

ii) අමනෝඥ දේශපාලන ජීවිතය හා බැඳුණු සමාජ යථාර්ථය.

ඒ අනුව;

★ ඇතැම් දේශපාලකයන් දේශපාලනයට ප්‍රවේශ වී ඇති ආකාරය

★ පීඩිත මිනිසා කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය

★ තම අඹුදරුවන් කෙරෙහි ඔවුන් දක්වන ආකල්පය

★ ඔවුන්ගේ ගූඪ ජීවන ස්වරූපය

★ දේශපාලනයේ ප්‍රචණ්ඩ ස්වරූපය

iii) ඉහළ පන්තිය නියෝජනය කරන පවුල්වල සමාජ යථාර්ථය.

ඒ අනුව;

★ ඔවුන්ගේ දූදරු දෙමාපිය සම්බන්ධතාවල දූරස්ථභාවය

★ මුළු ජීවිත කාලය ම ධනය ඉපයීම ම පරමාර්ථ කොටගත් බව

★ අවසාන කාලයේ සාත්තු නිවාසවල ඔවුන් ගත කරන හුදකලා ජීවිතය

iv) ආර්ථික දරිද්‍රතාව නිසා මෙහෙකාර සේවාවේ නිරත තරුණියන්ගේ ජීවිත යථාර්ථය.

★ ආයාගේ චරිතයේ ඇති කටුකත්වය හා ඇය මුහුණ දෙන පීඩනය

★ ඈ තුළ මතු වන තාරුණ්‍යයේ මනෝභාව

V. ළමා ලෝකය හා බැඳුණු සමාජ යථාර්ථය

★ ළමා ජීවිතවල ඇති කෙළිලොල් බව

★ ළමා සිත්සතන් තුළ පවතින නිර්ව්‍යාජ භාවය

ආදි කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

7. "කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ එක් ප්‍රධාන පරමාර්ථයක් වූයේ තම සහෘදයන් ජාතිකාභිමානයෙන් ඔදවත් කිරීම යි." කවීන් **දෙදෙනකුගේ** පද්‍ය නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ ප්‍රධාන පරමාර්ථයක් වූයේ සහෘදයා තුළ ජාතිකාභිමානය දැනවීම යි. නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරෙන් මෙයට අදාළ කරුණු ගෙනහැර දැක්වීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ අතර ඇති ජී. එච්. පෙරේරා විසින් රචිත ''පරලොවට පණිවිඩයක්'' සහ ඇස්. මහින්ද හිමියන් විසින් රචිත 'දරු නැළවිල්ල' නිදසුන් ලෙස යොදා ගත හැකි ය.

උපහාස රසය යොදා ගනිමින් සිංහලයා තුළ පැවති පරගැති බව හෙළා දැකීමට ''පරලොවට පණිවිඩයක්'' පද්‍ය පන්තියෙන් උත්සාහ දරා ඇති ආකාරය නිදසුන් මගින් තහවුරු කළ යුතු ය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

★ පරගැති සිරිත් විරිත් උපහාසයට ලක්කිරීම

උදා :- ''පිටරටට වදාරායි, කාපු දේවත් වමාරයි.''

★ දේශීය සංස්කෘතිය අභිභවනය කර බටහිර සංස්කෘතිය ඉස්මතු වීම

උදා :- ''සිංහල සිරිත දැන් නම් තුට්ටුවක් නෑ වටින්නේ''

★ පෙරදිග භාෂා යටපත් කොට ඉංග්‍රීසි බස මතුවීම හා දෙමළ බස ඉගෙනීමේ මතු අවශ්‍යතාව.

උදා :- ''උගතයුතු ඉංග්‍රිස් ඒ නමුත් පොඩ්ඩකින් බෑ''

''සිහල බස කමක් නෑ, ඒ උගැන්මෙන් පලක් නෑ''

''දෙමළ බස ටිකක් වත් පාඩුවක් නෑ උගත්තොත්''

★ කළු හම ලැබීමෙන් සිදුවන පාඩුව

උදා :- ''හම සුදුවට නැත්නම් සායමක් වත් ගෙනෙල්ලා''

පාඨකයා තුළ ජාතිකාභිමානී හැඟීම් දැනවීම සඳහා ලංකාවේ අතීත ශ්‍රී විභූතියත්, ආදි හෙළයාගේ වීරත්වයත් ගෙනහැර පෑමට ඇස්. මහින්ද හිමිගේ ''දරු නැළවිල්ල'' පද්‍ය නිර්මාණයෙන් උත්සාහ දරා ඇති ආකාරය නිදසුන් මගින් තහවුරු කළ යුතු ය.

★ දරුවකු නළවන නැළවිලි ගීයක ආකාරයෙන් රචනා වුව ද එමගින් පාඨකයා අවදි කිරීමට උත්සාහ දරා ඇති බව

උදා :- ''මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ''

★ මවුබිම වෙනුවෙන් සිංහලයා සතු යුතුකම සිහිපත් කර දීම

උදා :- ''ඒ බව සිහිකොට මෙලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ''

★ සිංහලයාගේ අතීත ශ්‍රී විභූතිය මතු කිරීම

උදා :- ''ලස්සන මෙන් මහපොළොවේ
අනුරාපුර ඉදිකෙරුවේ''

★ මව්බිම වෙනුවෙන් දිවි පිදීමට වුව එඩිතර විය යුතු බව

උදා :- '' ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ''

මෙවැනි තවත් උදාහරණ ගෙනහැර දක්වමින් ඉහත මතය සනාථ කළ යුතු ය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**8.** පැරණි භාරතීය ප්‍රභූ සමාජයේ දුර්වලතා කලාත්මක ව නිරූපණය කිරීමෙහි ලා **රත්නාවලී** නාට්‍යයේ කතුවරයා දරන ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැයි නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි.)

රත්නාවලී නාට්‍යයෙහි අපට හමුවන පැරණි භාරතීය ප්‍රභූ චරිත කිහිපයකි. ඒ අතරින් මෙහි ප්‍රධාන චරිතය වන උදයන රජුගේ චරිතයේත්, ඔහුගේ අනුශාසකයා ද, මිතුරා ද වන විදූෂක හෙවත් වසන්තකගේ චරිතයේත් ගැබ් වූ දුබලතා කලාත්මක ලෙස නිරූපණය කරන්නට නාට්‍ය රචකයා සමත් වෙයි.

උදයන රජු :- සංස්කෘත නාට්‍ය නියමයන්ට අනුව නිරූපිත මෙම චරිතය කෙළිලොල්, විනෝදකාමී හා කාමාසක්ත ලක්‍ෂණවලින් සමන්විත වේ. එහෙත් වගකීමෙන් තොර ව කටයුතු කරන එම චරිතය ප්‍රේක්ෂකයා තුළ විමතියක් ද, කුතුහලයක් ද හාස්‍ය හා උපහාස රසයක් ද දනවයි. එම චරිතයට ආවේණික වූ මේ ස්වභාවය එහි දිස්වන දුබලතා ලෙස ද කෙනෙකුට ඉදිරිපත් කළ හැකි ය.

එයට නිදසුන් පහත දැක්වේ.

★ පළමු අංකයේ දී රජු සේවිකාවන්ගේ සරදමට ලක්වීම.
උදා :- ''රජතුමනි, අන්න බිසොවුන් වහන්සේ, ඔබ වහන්සේට නියෝග කරනවා. නෑ නෑ ගෞරවයෙන් දැනුම් දෙනවා..''

★ සාගරිකා කෙරෙහි ප්‍රේමයෙන් බැඳුණු රජ තම බිසව ඉදිරියේ වංචනික ලෙස හැසිරීම.
උදා :- ''දේවිය සැක හිතන්ඩ එපා. මේ මම නිකම්ම හිතල ඇඳපු රූපයක් මිස කවදාවත් ම දැකපු කෙනෙක් නෙමෙයි. ''

★ තම බිසවට දක්වන බිය හා යටහත් බව.
උදා :- ''දේවිය, වංචාව අතටම අහුවුණාට පස්සෙ මම මොනව කියන්න ද? එහෙම වුණත්... (දෙපාමුල වැටෙමින්)

★ විදූෂක චරිතය මගින් ද නිරූපණය කෙරෙන්නේ තම තනතුරට හිමි වගකීම් ඉටු කිරීමට වඩා රජුගේ සිතැඟි ඉටු කර ගැනීමට අනුබල දීමයි.

උදා :-
i. රජුගේත් සාගරිකාගේත් සම්බන්ධය සඳහා කටයුතු කිරීම.
ii. සාගරිකා පිළිබඳ රජුගේ හැඟීම් උත්තේජනයට අනුබල දීම.
iii. වාසව දත්තා බිසවට වංචා කිරීම.
iv. සේවිකාවන්ගේ සරදමට ලක්වීම.
v. සැළලිහිණියා කෙරෙහි ද්වේශ සහගත වීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 71 - සිංහල II

### ලකුණු බෙදීයාම

1, 2, 3 ඇතුළු ව ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ප්‍රශ්නය | (බහුවරණ) | - | ලකුණු 01 x 20 = 20 |
| 2. | ප්‍රශ්නය | (අ) අවබෝධය | - | ලකුණු 02 x 05 = 10 |
| | | (ආ) සාරාංශය | - | ලකුණු = 15 |
| | | | | 25 |
| 3. | ප්‍රශ්නය | රචනය | - | ලකුණු 25 |
| 4. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | (ආ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | (ඉ) | - | ලකුණු 01 x 05 = 05 |
| | | | | 15 |
| 5. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු 01 x 03 = 03 |
| | | (ආ) | - | ලකුණු 01 x 03 = 03 |
| | | (ඉ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඊ) | - | ලකුණු 01 x 06 = 06 |
| | | | | 15 |
| 6. | ප්‍රශ්නය | | - | ලකුණු (01 x 03) × 05 = 15 |
| 7. | ප්‍රශ්නය | (අ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ආ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඉ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (ඊ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | (උ) | - | ලකුණු $\frac{1}{2}$ x 06 = 03 |
| | | | | 15 |
| 8. | ප්‍රශ්නය | (i) පද බෙදීම | | = 03 |
| | | විරාම ලක්ෂණ | | = 04 |
| | | (ii) - (v) | - | ලකුණු 02 x 04 = 08 |
| | | | | 15 |



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

| විෂය අංකය பாட இலக்கம் | 71 | විෂයය பாடம் | සිංහල |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 1 | 11. | 3 |
| 02. | 2 | 12. | 4 |
| 03. | 4 | 13. | 2 |
| 04. | 5 | 14. | 3 |
| 05. | 1 | 15. | 5 |
| 06. | 4 | 16. | 1 |
| 07. | 2 | 17. | 2 |
| 08. | 3 | 18. | 3 |
| 09. | 5 | 19. | 2 |
| 10. | 1 | 20. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් ශ්‍රමශක්තිය දියුණු කිරීම සහ උපයෝජනය පිළිබඳ සියලු ම මූලික ක්‍රියාවලීන්හි පදනම වනුයේ අධ්‍යාපනය යි. අධ්‍යාපනය මිනිස් ශ්‍රමශක්ති ඉල්ලුමෙහි සහ සැපයුමෙහි වර්ධනයට ඉවහල් වන ක්‍රම විවිධ මෙන් ම සංකීර්ණ ය. පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීමෙහි ලා අධ්‍යාපනය සතුව ඇත්තේ සෘජු කාර්යයකි. එමගින් මිනිස් ශ්‍රමශක්තිය මෙහෙයවීමෙහි සහ පතුරුවාලීමෙහි මෙන් ම නිපුණතාවන් ලබා ගැනීමෙහි ලා වූ මූලික පෙලඹීම් සාධක ක්‍රියාත්මක කෙරේ. අන් සෑම කරුණකට ම වඩා එමගින් මිනිස් විචල්‍යයන් ක්‍රියාත්මක ව සංස්කෘතික සහ සමාජ සැකැස්ම සැපයේ.

පොදු අධ්‍යාපන ක්‍රමයක් සතු කාර්යය ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම 'පුහුණු කළ හැකි' බවට පත් කරන මූලික අධ්‍යාපනික පසුබිමක් ඔවුනට ලබා දීම යි. ප්‍රාථමික අධ්‍යාපන තත්ත්වයේ දී පිළිබිඹු වන මෙම ප්‍රවීණතාව වූකලී අකුරු දැනීමෙහි වැඩි දියුණුව සඳහා වූ වෙනස පිළිබඳ අවබෝධයෙහි ප්‍රතිඵලය යි. ඇතැම් පර්යේෂකයන් විසින් මූලික අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර නියත අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇති බව පෙන්වා දී තිබේ. ද්විතීයික මට්ටමේ දී අධ්‍යාපනය, ලිපිකාර සහ අලෙවි කටයුතුවල නියුක්තවූවන් සහ ගුරුවරුන් යනාදි විශාල පුද්ගල සංඛ්‍යාවක් ඇතුළු පුහුණු කළ හැකි නා නා මාදිළියේ ශ්‍රමිකයන් බිහි කිරීමට ඉවහල් වනු පමණක් නොව, එහි අන්තර්ගත වෘත්තීය සහ විවිධීකෘත අංග මගින්, නොයෙක් ශිල්පීන්ටත් පහළ ශ්‍රේණිවල පරිපාලකයන්ටත් අවශ්‍ය මූලික දැනුම ලබා දෙයි. පැහැදිලි වශයෙන් ම මධ්‍ය සහ ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය වනුයේ ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම යි. උසස් අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටෙහි ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩි වේ. මෙපරිද්දෙන්, සෑම මට්ටමක දී ම, අධ්‍යාපනික අවස්ථා, සමාජ සහ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවට සීමා නොකොට ම ඒ හා සම්බන්ධ කර ලීම වැදගත් බව පැහැදිලි ය.

(i) අධ්‍යාපනය සතුව ඇති සෘජු කාර්යභාරයක් වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ii) මූලික අධ්‍යාපන පසුබිම යනුවෙන් මේ ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?

(iii) ඇතැම් පර්යේෂකයන් විසින් දක්වනු ලැබ ඇති ආකාරයට අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර පවතින්නේ කෙබඳු සබඳතාවක් ද?

(iv) මධ්‍ය හා ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය කුමක් ද?

(v) උසස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස ලේඛකයා දක්වන්නේ කුමක් ද? (ලකුණු 10 යි.)

(අ) සඳහා පිළිතුරු

i. පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීම

ii. ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම පුහුණු කළ හැකි බවට පත් කිරීම

iii. නියත අන්‍යෝන්‍ය සබඳතාවක්

iv. ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම (කොටස් තුනක් ඇත්නම් ලකුණු 01කි. සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. වෘත්තිකයන්/ශ්‍රමිකයන් යනුවෙන් යොදා ඇත්නම් ලකුණු 01කි.)

v. රටේ ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩිවීම

(ලකුණු 2 x 5 = 10යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අද බලවත් ම සමාජ ආයාචනය බවට පත්ව ඇත්තේ සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීම බව පැවසේ. එක්සත් ජාතීන් විසින් දස වසරින් දස වසර ලෝක සංවර්ධනයට තේමාවක් ලබා දෙන ලදි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන දශකවලින් විස්තර වන පරිදි 90 දශකයේ ලෝක සංවර්ධන උපාය මාර්ගවල එක් ප්‍රධාන ක්‍රමෝපායක් වූයේ තිරසර සංවර්ධනය කරා යන ගමන සඳහා ලෝක ජනතාව සූදානම් කිරීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පවරමින් තම සහාය ද ප්‍රදානය කිරීම යි.

සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය ම වෙයි. ඒ අනුව මානව සුබසාධනය ද පරිසර සුබසාධනය (සංරක්ෂණය) ද වැදගති. එයින් පෙනෙන්නේ පරිසරය සුරක්ෂණය කිරීම අවසාන වශයෙන් මානවයාගේ පැවැත්ම සනාථ කරන බව යි. ඒ අනුව සංවර්ධනයේ පරම අරමුණ මිනිසාගේ සුබසාධනය නම් 'පරම සම්පත' ද මිනිසා ම වනු නියති. එහි අනෙක් අන්තය නම් මිනිස් සම්පත සතු පරම සම්පත පරිසරය බව යි.

පාරිසරික වශයෙන් තිරසර වූත්, ආර්ථික වශයෙන් පවත්වා ගෙන යා හැකි වූත් සමාජීය වශයෙන් සර්ව සාධාරණ වූත් සංවර්ධනයක් ලබා ගත හැක්කේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ජනතාවට නැත. ජගත් සංවිධානවලට නැත. සැබවින් ම ඒ කවරකට වුව එම අදහසින් මිදිය හැකි ද නොහේ.

මානව සම්පත් සංවර්ධනය යනු විසින් අර්ථ ප්‍රමාණික කරනු ලබන්නේ පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික වශයෙන් ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි ලෝක ජනතාවක්, ලෝක ජන සමාජයක් බිහි කිරීම යි. (ලකුණු 15 යි.)

(ආ) සාරාංශය

- සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීමේ අවශ්‍යතාව
- 90 දශකයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන උපාය මාර්ගවල තිරසර සංවර්ධනය අත්පත් කර ගැනීමේ දී ලෝක ජනතාව සූදානම් කරවීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පැවරීම
- සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය වන හෙයින් මානව සුබසාධනය හා පරිසර සුබසාධනය ද එක සේ වැදගත් වීම
- පරිසර සංරක්ෂණය මගින් මානව පැවැත්ම සනාථ වීම
- පාරිසරික, ආර්ථික හා සමාජීය වශයෙන් සර්වසාධාරණ වූ සංවර්ධනයක් ලබාගත හැකි වන්නේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ප්‍රජාවට හා ජගත් සංවිධානවලට නැති බව අවබෝධ කර ගැනීම
- පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික අභියෝගවලට මුහුණදිය හැකි ලෝක ජන සමාජයක් බිහිකිරීම මානව සම්පත් සංවර්ධනය නම් වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 65 -75 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 03ක් අඩු වේ.**

| | | |
|---|---|---|
| සාරාංශය නියමිත වචන ප්‍රමාණයට | - | ලකුණු 03 යි. |
| අක්ෂර වින්‍යාසයට | - | ලකුණු 04 යි. |
| අන්තර්ගතයට | - | ලකුණු 08 යි. |



Aevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග
(ii) ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග
(iii) රුපියල අවප්‍රමාණය වීම මගින් මෙරට ආර්ථිකය කෙරෙහි ඇති වන බලපෑම
(iv) රටක සංහිඳියාව උදෙසා සංස්කෘතික උත්සව මගින් ලැබෙන දායකත්වය
(v) ප්‍රමාණාත්මක භාවයෙන් මෙන් ම ගුණාත්මක භාවයෙන් ද අධ්‍යාපනය අනූන විය යුතු ය.
(vi) සිංහල සිනමාව ජාත්‍යන්තර තලයට ගෙන ඒමේ අවශ්‍යතාව (ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශිකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
vii. සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) සිරකරුවන් මනුෂ්‍යයෝ වෙති.
(ii) රජය විසින් නාවික හමුදාවට නවක සෙබළුන් බඳවා ගැනෙති.
(iii) මහනාහිමියන් කුලපති ධුරයෙන් පිදුම් ලැබූහ.
(iv) මැන්ඩිස් ගුණසේකර මුදලිතුමාණෝ භාෂා පරිවර්තකයකු මෙන් ම සාහිත්‍යධරයෙක් ද වූහ.
(v) ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයන් නොබෝදා දැයෙන් සමු ගත්හ. (ලකුණු 05 යි.)

i. සිරකරුවෝ මනුෂ්‍යයෝ වෙති.
ii. රජය විසින් නාවික හමුදාවට නවක සෙබළු බඳවා ගැනෙති.
iii. මහනාහිමියෝ කුලපති ධුරයෙන් පිදුම් ලැබූහ.
iv. නිවැරදි වැකියකි.
v. ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයෝ නොබෝදා දැයෙන් සමු ගත්හ.

**(ලකුණු 1 x 5 = 05යි.)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.
(i) ඇමතිතුමා සාහිත්‍යධරයන් අගය කරයි.
(ii) පක්ෂ ලේකම්වරු නගරසභාවලට අපේක්ෂකයන් නම් කළහ.
(iii) ආරක්ෂක භටයෝ නගරයේ දී අප පරීක්ෂා කළහ.
(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපිරිසිදු ආපණශාලා හිමිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරති.
(v) විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරු මා පැසසූහ. (ලකුණු 05 යි.)

i. ඇමතිතුමා විසින් සාහිත්‍යධරයෝ අගය කෙරෙති / කෙරෙත් / කරනු ලබත් / ලැබෙත් / ලබති / ලැබෙති.

ii. පක්ෂ ලේකම්වරුන් විසින් නගරසභාවලට අපේක්ෂකයෝ නම් කෙරුණු / කෙරුණාහ / කෙරුණාහ / කරන ලදහ / කරන ලද්දෝ ය /කරනු ලැබූහ / කරනු ලැබුවෝ ය.

iii. ආරක්ෂක භටයන් විසින් නගරයේ දී අපි පරීක්ෂා කෙරුණුමු / කරන ලදුමු / කරන ලද්දෙමු / කරනු ලැබූමු / ලැබුණෙමු / ලැබුවෙමු.

iv. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් අපිරිසිදු ආපණශාලා හිමිකරුවෝ අධිකරණයට ඉදිරිපත් කෙරෙති / කෙරෙත් / කරනු ලබත් / ලැබෙත් / ලබති / ලැබෙති.

v. විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරුන් විසින් මම පැසසුණෙමි / පැසසිණිමි / පසසන ලදිමි / පසසන ලද්දෙමි / පසසනු ලැබුවෙමි / ලැබුණෙමි / ලැබීමි.

(ලකුණු 1 x 5 = 05යි.)

(ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) වාග්විද්‍යාඥයෝ නව භාෂා (රීතීන්/රීතිහු) විග්‍රහ කරති.
(ii) ඇමතිතුමා ශිෂ්‍යත්වලාභීන් කොළඹට (කැඳවයි/කැඳවති).
(iii) (දරුවෝ/දරුවන්) වියපත් වූ පියාණන් රැකබලා ගනිති.
(iv) ගුරුළුගෝමී විසින් ධර්මප්‍රදීපිකාව රචනා (කරන ලදි/කරනු ලබයි).
(v) (කිඹුලෝ/කිඹුලන්) ගම් වදිති'යි ගැමියෝ බියෙන් පසු වෙති. (ලකුණු 05 යි.)

i. රීතීන්
ii. කැඳවයි
iii. දරුවෝ
iv. කරන ලදි
v. කිඹුලන්

(ලකුණු 1 x 5 = 05යි.)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.
(i) ජාතීන් අතර **අන්‍යෝන්‍ය** අවබෝධය ඉතා අගනේ ය.
(ii) අධිකරණය **චූදිතයා** නිදහස් කරයි.
(iii) චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ **දුරවබෝධ** පද නිතර හමු වෙයි. (ලකුණු 03 යි.)

i. ඔවුනොවුන් (අතර)
ii. චෝදනාවට ලක්වූ පුද්ගලයා / චෝදනා ලැබූ පුද්ගලයා
iii. අවබෝධ කර ගැනීමට අපහසු / දුෂ්කර / අමාරු

(ලකුණු 1 x 3 = 03යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) විද්‍යාව දැනගත් පුද්ගලයා
(ii) කෘතියක ගැටලු සහිත පද පහදා දෙන සාහිත්‍ය ග්‍රන්ථ
(iii) විචාර බුද්ධියෙන් තොරව කිසියම් මතයක එල්බ ගැනීම (ලකුණු 03 යි.)

i. විද්‍යාඥයා
ii. ගැටපද
iii. ආධානග්‍රාහී

**(ලකුණු 1 x 3 = 03යි.)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ඩෙංගු රෝගය මැඩීම සඳහා පාසල් ...................... පිරිසිදු ව තබා ගත යුතු ය.
(ii) අඩු මිල විදුලි ...................... නිෂ්පාදනයෙන් චීනය ඉදිරියෙන් සිටී.
(iii) අනුරාධපුර නගරයේ දී ගොවි ......................පැවැත්විණි.
(iv) වීරෝදාර සෙබළු යුද්ධ ...................... වෙත අවතීර්ණ වූහ.
(v) ලෝක සාමය පිළිබඳ ජාත්‍යන්තර ...................... ජිනීවාහි දී පැවැත්වේ.
(vi) තාක්ෂණික ...................... මිනිසාගේ බුද්ධිබලය හීන කරයි.

(මෙවලම්, බිම, සම්මන්ත්‍රණය, භූමිය, සමුළුව, උපකරණ) (ලකුණු 03 යි.)

i. බිම
ii. මෙවලම්
iii. සමුළුව
iv. භූමිය
v. සම්මන්ත්‍රණය
vi. උපකරණ

**(ලකුණු ½ x 6 = 03යි.)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) භාණ්ඩයක **කල්** පැවැත්ම කෙරෙහි කවුරුත් අවධානය යොමු කරති.
(ii) **ලද** යන්නෙහි ලැබූ අර්ථය ඇත.
(iii) ඔහු සහික ධුරයකට **පත්** කෙරෙයි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) සොරා **පැන** දුවයි.
(vi) යුද්ධය නිසා බොහෝ දරුවන්ට **පිය** සෙනෙහස අහිමි විය. (ලකුණු 06 යි.)

i. කල් (කාලය) ප්‍රිය, මනෝහර, යහපත්, කාන්තාව, වල්ලභයා, ලීලාව, විලාසය, විනාශය, ආදරය
ii. ලද (ලැබූ) ලබ්ධිය, ලජ්ජාව, විලඳ, තරුණ ස්ත්‍රිය, අලුත්
iii. පත් (ප්‍රාප්ත / පැමිණි) පත්‍රය, කොළය, පාත්‍රය, පිහාටුව, යෝග්‍ය, මාර්ගය, ලියමන, විජිනිපත, නැළිය, බොකු ගැසූ අතට අල්ලන ප්‍රමාණය, කන් පෙත්ත
iv. පුර (පුර පක්ෂය / පිරුණු) නගරය, අන්තඃපුරය, රට, දේශය, පුර (විධි ක්‍රියා අර්ථය)
v. පැන (පලායාම / පැනයාම) ප්‍රශ්නය, ප්‍රඥාව, ජලය, කලස, කළය
vi. පිය (පියා) පාදය, අඩිය, පාදුකාව, පිහිට, ප්‍රිය, ප්‍රියාව, කාන්තාව, ස්වාමි පුරුෂයා, පියාපත, ඇස් පිහාටුව, මොරගස, ප්‍රීතිය, ජාතිය, භවය, බීම, අත් හැරීම යන ක්‍රියාර්ථය

**(ලකුණු 1 x 6 = 06යි.)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) ප්‍රියයාගේ **වියෝගය** දරනු නොහැකි ව **මුවඟන** තම **නුවනත** කඳුළින් පුරවා ගත්තා ය. (**වියෝගය** - උපසර්ග, **මුවඟන** - සන්ධි, **නුවනත** - තද්ධිත)

(ii) වැද්දා **ඔබිනොබ සරන වනසතුන්** ඉලක්ක කර හීයක් විද්දේ ය. (**ඔබිනොබ** - සන්ධි, **සරන** - කෘදන්ත, **වනසතුන්** - සමාස)

(iii) **ජ්‍යෙෂ්ඨ** ශිෂ්‍යයන්ගේ නොමනා ක්‍රියා නිසා ඇතැම් **නවක ශිෂ්‍යයෝ** සරසවිය අත් **හැර** යති. (**ජ්‍යෙෂ්ඨ**-තද්ධිත, **නවක ශිෂ්‍යයෝ** - සමාස, **හැර** - ක්‍රියා)

(iv) **සුරාසුර යුද්ධයෙහි** දී පරාජය වූවෝ **දෙව්ලොව** හැර පලා ගියහ. (**සුරාසුර** - සන්ධි, **යුද්ධයෙහි** - විභක්ති, **දෙව්ලොව** - සමාස)

(v) "**අනේ!** එ විපත සිදු වුණි. නො **දනිමි කාගෙ** දොසා" (**අනේ** - නිපාත, **දනිමි** - ක්‍රියා, **කාගෙ** - විභක්ති)

(ලකුණු 15 යි.)

| | | | |
|---|---|---|---|
| (i) | වියෝගය | උපසර්ග | විරුද්ධාර්ථයේ / නිෂේධාර්ථයේ උපසර්ග |
| | මුවඟන | සන්ධි | පරස්වර ලෝප සන්ධිය / පරසර ලොප් සඳ |
| | නුවනත | තද්ධිත | ස්වාර්ථයේ / එය ම යන අර්ථයේ |
| (ii) | ඔබිනොබ | සන්ධි | ස්වර සන්ධි / සර සඳ |
| | සරන | කෘදන්ත | වර්තමාන කෘදන්ත / වර්තමාන කර්තෘ කාරක කෘදන්ත |
| | වන සතුන් | සමාස | විභක්ති සමාස / විබත් සමස්, ආධාර විභක්ති සමාස / අදර විබත් සමස් |
| (iii) | ජ්‍යෙෂ්ඨ | තද්ධිත | උත්කෘෂ්ටාර්ථයේ (ඉහළ යන/උසස් යන/වඩා යන අර්ථයේ) |
| | නවක ශිෂ්‍යයෝ | සමාස | විශේෂණ සමාස / වෙසෙසුන් සමස්, විශේෂණ පූර්ව පද සමාසය |
| | හැර | ක්‍රියා | පූර්ව ක්‍රියා / පෙර කිරිය |
| (iv) | සුරාසුර | සන්ධි | සමාන ස්වර දීර්ඝ සන්ධිය / සවර්ණ ස්වර දීර්ඝ සන්ධිය |
| | යුද්ධයෙහි | විභක්ති | ආධාර විභක්ති / අදර විබත් (සප්තමී විභක්ති) |
| | දෙව්ලොව | සමාස | විභක්ති සමාස / විබත් සමස්, සම්බන්ධ විභක්ති සමාස / සබඳ විබත් සමස් |
| (v) | අනේ | නිපාත | ඛේදාර්ථයේ / භාවාර්ථයේ (ශෝකය ප්‍රකාශ කිරීම් අර්ථයේ) |
| | දනිමි | ක්‍රියා | වර්තමාන ක්‍රියා/ත්‍රෛකාලික ක්‍රියා/ශුද්ධ ක්‍රියා/අවසාන ක්‍රියා |
| | කාගෙ | විභක්ති | සම්බන්ධ විභක්ති / සබඳ විබත් (ෂෂ්ඨී විභක්ති) |

(ලකුණු (1 x 3) x 5 = 15යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) වැරදි කරන්නා කාටත් වැරදි කරයි.

(ii) තනතුරට වඩා හැසිරෙන ආකාරය වෙලාවක දී වටින්නේ ය.

(iii) තමාගේ දියුණුව තමා ම සලසා ගන්න.

(iv) වැඩ දෙකක් ම එකවර කර ගැනීම

(v) යහපත් දේ කළත් නපුරු මිනිසා යහපත් ගති ඇත්තෙකු නොවීම

(vi) කෙනෙකුගේ ගති ගුණ වෙනස් කළ නොහැකි වීම (ලකුණු 03 යි.)

i. විදින ගුල්ලා රත්තරන් භාජනේ උනත් විදිනව ලු.
පැණි වරකා ගහටත් හෙණ ගහනව ලු.

ii. ලැජ්ජ නැතිකම මහමුදලිකමටත් වඩා ලොකුයි ලු.

iii. තමන් හිසට තම අතමය සෙවණැල්ල / වෑයම් මිසක් නෑයන් මොට ද කලියුගේ

iv. දඹුලු ගොහින් තලගොයිත් මරාගෙන ආවා වගේ
එක ගලෙන් කුරුල්ලො දෙන්නෙක් මරාගත්තා වගේ
බුදුන් වැඳගෙන කෙමනත් බලාගෙන ආවා වගේ

v. කිරෙන් සේදුවත් අඟුරු සුදුවෙන්නෙ නෑ වගේ

vi. වඳුරා හැට පිරුණත් බිම ගමන් නැතුවා වගේ
උපන්ගෙයි සිරිත බලි ඇරියත් අරින්න බැහැ වගේ
කොටියගෙ පුල්ලි මකන්න බැරුවා වගේ
ආරේ ගුණ නෑරේ
උණ පුරුකේ දැමුවත් බලු වලිගේ ඇද නෑරේ

**(ලකුණු ½ x 6 = 03යි.)**

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) අමු කැවිලා (ii) අං මතුවෙලා

(iii) දෝරේ යනවා (iv) වැදි බණ

(v) දෙකට දෙවාරම් (vi) අකලට මෝරලා (ලකුණු 03 යි.)

i. තාවකාලික ව පියවි සිහියෙන් තොර වීම / සිහිය විකල් වීම

ii. අහංකාරකම ඉස්මතු වීම

iii. පිරී ඉතිරී යාම

iv. තමන් නොපිළිපැද අනුන්ට දෙන අවවාද

v. තීන්දුවක් නො ගෙන / පැත්තක් නො ගෙන / තීරණයකට නො පැමිණ

vi. සුදුසු කාලයට නො පැමිණ මුහුකුරායාම

**(ලකුණු ½ x 6 = 03යි.)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පදය සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) දිග - පළල (ii) වං - හුං
(iii) බැළ - මෙහෙවර (iv) හයි - හක්තිය
(v) හැල - හැප්පුම් (vi) දෙගුණ - තෙගුණ (ලකුණු 03 යි.)

i. එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම
ii. අර්ථ රහිත පද දෙකක් යෙදීම
iii. පද දෙකේ ම අර්ථ සමාන ව යෙදීම
iv. මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම
v. වචන යුගලය එක්ව අර්ථය තීව්‍ර කිරීම
vi. මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / එකිනෙකට වෙනස් අරුත් දනවන පද දෙකක් යෙදීම

**(ලකුණු ½ x 6 = 03යි.)**

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) දිය කැට පහණ (ii) කෝණම
(iii) තිහව (iv) පිරිවැස්ස
(v) ඇන්න යනවා (vi) රැනා (ලකුණු 03 යි.)

i. ජල මාපකය / වැවේ ජලය මනින ස්තම්භය
ii. අලුත් අවුරුද්ද
iii. තිස්සමහාරාමය
iv. ආන / අලුව / හළුව
v. අරගෙන යනවා
vi. බළලා / පූසා

**(ලකුණු ½ x 6 = 03යි.)**

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) තොත්තෙ (ii) දහ අට හොඳයි
(iii) මුදුනා (iv) පුබ්බරු
(v) බය්යනවා (vi) දෙයියන්ගේ බෝව (ලකුණු 03 යි.)

i. පස්සට යාම
ii. දහනවය
iii. හරක් බානේ මුලට ම සිටින හරකා
iv. බත්
v. නිදා ගන්නවා
vi. කමතේ දී දෙවියන්ට වෙන් කරන වී

**(ලකුණු ½ x 6 = 03යි.)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චිත්‍රාකුමරියරූපයෙන්අග්‍රප්‍රාප්තයසියලුස්ත්‍රීමායමින්පාරප්‍රාප්තයමදමුදුලලිතභාෂණයෙන්දනෙත්කොන්බැල්මහාමුසුවූමන්දස්මිතයෙන්දයෞවනයන්උන්මාදයටපත්කරනහෙයින්ඇඋන්මාදචිත්‍රානම්වූවායනෛමිත්තිකයන්ගේඅනාවැකිඅසාභීතියටපත්දෙමවුපියන්විසින්ඇඑක්ටැම්ගෙයකසිරකරනුලැබූවායඅහෝඇදුක්මුසුවඑහිහුදකලාවදිවිගෙවූවායඑකලගාමිණීනම්වූඅභිරූපසම්පන්නයෞවනයෙක්වූයේයඋත්තුංගදේහධාරියකුවූහෙයින්හෙතෙමදීඝගාමිණීනම්වියදෛවෝපගතවමෙන්ඔවුන්දෙදෙනාඅතරප්‍රේමසම්බන්ධයක්ඇතිවියමාප්‍රේමියකෙදිනකහෝඔබමාගේපාදපරිචාරිකාවකරගනිමියිඔහුඇයටපොරොන්දුවූයේයමාපෙම්බරකුමරාණමාගේඒකායනප්‍රාර්ථනයදඑයමුත්මමමේසිරකුටියෙන්කෙසේමිදෙම්දැයිඇශෝකයෙන්බරවවිචාළායසොඳුරියමමඔබදකිනුපිණිසහැකිවිගසින්එන්නෙමියිකියාඔහුඇයගේදර්ශනපථයෙන්ඉවත්වගියේයදිනසතිමාසගෙවීගියේයවසන්තකාලයදඋදාවියපූර්ණචන්ද්‍රයානභෝතලයශෝභාවත්කෙළේයපුලපුලාබලාසිටිරූපකායඇයඇස්මානයේපෙනීසිටියේයමුරසේවිකාවක්අදරාත්‍රියේකුමරුන්ඔබවෙතඑතියිදැනුම්දුන්නායඔහුකක්කටකයන්ත්‍රයකකකුළුවකුගේආකාරයෙන්තැනූයන්ත්‍රයකආධාරයෙන්එක්ටැම්කුලුනනැග්ගේයසඳවරින්වරවලාකුළුඅතරසැඟවගියේයඅරුණෝදයේළාහිරුරැස්ඔවුනගේකුටියආලෝකවත්කෙළේයඇහඬමින්මඳසුසුම්හෙළමින්නෙතුකඳුළින්පුරමින්ඔහුටසමුදුන්නාය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **ගෞරවාර්ථ ප්‍රත්‍යයක්** සහිත ආමන්ත්‍රණ පදයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) **'ක'** වර්ගයට අයත් **ඝෝෂ මහාප්‍රාණ** අක්ෂරයක් සහිත පදය උපුටා ලියන්න.

(iv) **අස්ත්‍යර්ථයේ තද්ධිත** ප්‍රත්‍යය සහිත පද **දෙකක්** ඡේදයෙන් තෝරා ලියන්න.

(v) **දේහධාරියකු** යන්නෙහි ඇති පිල්ලම් නම් කරන්න.

(ලකුණු 15 යි.)

චිත්‍රා කුමරිය රූපයෙන් අග්‍රප්‍රාප්ත ය; (අග්‍රප්‍රාප්ත ය,) සියලු ස්ත්‍රීමායමින් පාරප්‍රාප්ත ය. මද මුදු ලලිත භාෂණයෙන් ද නෙත්කොන් බැල්ම හා මුසු වූ මන්දස්මිතයෙන් ද යෞවනයන් උන්මාදයට පත් කරන හෙයින් ඈ උන්මාදචිත්‍රා නම් වූවා ය. නෛමිත්තිකයන්ගේ අනාවැකි අසා භීතියට පත් දෙමවුපියන් විසින් ඈ එක්ටැම් ගෙයක සිරකරනු ලැබූවා ය. අහෝ! ඈ දුක්මුසු ව එහි හුදකලාව දිවි ගෙවූවා ය. එකල ගාමිණී නම් වූ අභිරූප සම්පන්න යෞවනයෙක් වූයේ ය. උත්තුංග දේහධාරියකු වූ හෙයින් හෙතෙම දීඝගාමිණී නම් වී ය. දෛවෝපගත ව මෙන් ඔවුන් දෙදෙනා අතර ප්‍රේම සම්බන්ධයක් ඇති විය. "මා ප්‍රේමිය, කෙදිනක හෝ ඔබ මාගේ පාදපරිචාරිකාව කර ගනිමි"යි ඔහු ඇයට පොරොන්දු වූයේ ය. "මා පෙම්බර කුමරාණ, මාගේ ඒකායන ප්‍රාර්ථනය ද එය මුත් මම මේ සිරකුටියෙන් කෙසේ මිදෙම් ද"යි ඈ ශෝකයෙන් බර ව විචාළා ය. "සොඳුරිය, මම ඔබ දකිනු පිණිස හැකි විගසින් එන්නෙමි"යි කියා ඔහු ඇයගේ දර්ශනපථයෙන් ඉවත් ව ගියේ ය. දින, සති, මාස (දිනසතිමාස) ගෙවී ගියේ ය. වසන්ත කාලය ද උදා විය. පූර්ණ චන්ද්‍රයා නභෝතලය ශෝභාවත් කෙළේ ය. පුල පුලා බලා සිටි රූපකාය ඇය ඇස්මානයේ පෙනී සිටියේ ය. මුරසේවිකාවක් "අද රාත්‍රියේ කුමරුන් ඔබ වෙත එති"යි දැනුම් දුන්නා ය. ඔහු කක්කටක යන්ත්‍රයක (කකුළුවකුගේ ආකාරයෙන් තැනූ යන්ත්‍රයක) (— කකුළුවකුගේ ආකාරයෙන් තැනූ යන්ත්‍රයක —) ආධාරයෙන් එක්ටැම් කුලුන නැග්ගේ ය. සඳ වරින්වර වලාකුළු අතර සැඟව ගියේ ය. අරුණෝදයේ ළාහිරු රැස් ඔවුනගේ කුටිය ආලෝකවත් කෙළේ ය. ඈ හඬමින්, මඳසුසුම් හෙළමින්, නෙතු කඳුළින් පුරමින් ඔහුට සමුදුන්නා ය.

**පද බෙදීමට ලකුණු 03යි.**

**විරාම ලක්ෂණවලට ලකුණු 04යි.**

ii. කුමරාණ

iii. දීඝගාමිණී

iv. ශෝභාවත් / ආලෝකවත්

v. කොම්බුව සහ දීර්ඝත්ව ලකුණය / හල් කිරීම, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල

**(ලකුණු 2 x 4 = 08යි.)**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .